වාර්ෂික කාර්යසාධන වාර්තාව

2023

නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන,

පර්යේෂණ හා නව නිපැයුම් අංශය

අධ්‍යාපන අමාත්‍යාංශය

2023 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව

නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් අංශය

වැය ශීර්ෂ අංකය - 126

		අන්තර්ගතය	පිටු අංකය
පරිච්ඡේදය	**01-**	ආයතනික පැතිකඩ / විධායක සාරාංශය	01
පරිච්ඡේදය	**02 -**	ප්‍රගතිය හා ඉදිරි දැක්ම	07
පරිච්ඡේදය	**03 -**	**2023** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා සමස්ත මූල්‍ය කාර්යසාධන ප්‍රකාශ	23
පරිච්ඡේදය	**04 -**	කාර්යසාධන දර්ශක	29
පරිච්ඡේදය	**05 -**	තිරසර සංවර්ධන අරමුණු **(SDG)** සපුරාගැනීමේ කාර්යසාධනය	30
පරිච්ඡේදය	**06 -**	මානව සම්පත් පැතිකඩ	33
පරිච්ඡේදය	**07 -**	අනුකූලතා වාර්තාව	35

පරිච්ඡේදය 01
ආයතනික පැතිකඩ / විධායක සාරාංශය

1.1 හැඳින්වීම

සෞඛ්‍ය, ආර්ථික, දේශපාලන, ගැටළු මධ්‍යයේ 2020-2022 වසර 3ක කාලය තුළ වෘත්තීය අධ්‍යාපන සම්පාදනයේ පැහැදිලි පසුබෑමක් පෙන්නුම් කළ බැවින් 2019 වසරට සාපේක්ෂව යථා පරිදි වෘත්තීය අධ්‍යාපනය සක්‍රීය වූ වසර 2023 වසරයි. වසර 3ක් තුළ එකිනෙක බද්ධව පැමිණි අර්බුදකාරී තත්වය හමුවේ පනවන ලද සීමා ඉවත් කළ පසුව මතුවන ගෙවුම් ශේෂය පියවීම සඳහා අවශ්‍ය විදේශ විනිමය ඉපයීම බරපතලම අර්බුදය බවට පත් වෙයි. මේ වසරේ දෙසැම්බර් මාසය වනවිට රජයේ විදේශ ඉපැයීම් සලකා බැලීමේ දී වාණිජ අපනයන (ඇ.ඩො.මි. 11910.0) හැරුණු විට ඊළඟ ප්‍රධානම ප්‍රභවය වන්නේ විදේශ ශ්‍රමිකයන් වෙතින් එන ප්‍රේෂණයන්ය. (ඇ.ඩො.මි.5970.0) මේ වනවිට විදේශගත වී ඇති ශ්‍රී ලාංකීකයන් ප්‍රමාණය මිලියන 3ක් පමණ වන අතර ඒ අතරින් මිලියන 1ක් ස්ථිර පදිංචිය සඳහා ගොස් ඇත. ඉතිරි අය විවිධ රටවල රැකියා සඳහා ගිය අයයි. මේ වසර තුළ විදේශ රැකියා සඳහා ගොස් ඇති පිරිස 297,648 කි. (තාවකාලික දත්ත) මේ අතරින් කොපමණ පිරිසක් සහතිකලත් වෘත්තීය අධ්‍යාපනයක් සහිත අයද යන්න තහවුරු වී නැත. මේ පසුබිම තුළ වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රය පිළිබඳ විවිධ පාර්ශවයන්ගේ තියුණු අවධානය යොමු වී ඇත.

මේ වනවිට නිපුණතා සංවර්ධන හා වෘත්තීය අධ්‍යාපන අංශය යටතේ ක්‍රියාත්මක ආයතන මඟින් විදේශ රැකියා අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණය සහිතව රැකියා අවස්ථා හඳුනාගනිමින් ඊට සමපාත වන පාඨමාලා ආරම්භ කිරීමට කටයුතු කරමින් සිටින අතර, DTET හා VTA ආයතන මඟින් විදේශීය රැකියා ඉලක්ක කරමින් ක්ෂේත්‍ර 12ක පාඨමාලාවලට ආධුනිකයින් 3426ක් යොමු කර ඇත. දේශීය කර්මාන්ත බිඳ වැටීම හේතුවෙන් පුහුණුලාභීන් රැකියාගත වීම අඩු වීමට ඇති ඉඩකඩ වළක්වාලීමට Pizza Hut, Projects Prospects, Akozonobel Paint Lanka, Causeway Paints Lanka, Genevieve International Academy, Toyota Lanka වැනි පුද්ගලික ආයතන සමඟ ගිවිසුම්ගත වෙමින් (PPP වශයෙන්) යටිතල පහසුකම් ද සලසමින් ආධුනික පුහුණුවට ඉඩකඩ විවෘත කර ඇත. ඒ මඟින් රජයේ වැය බරද අවම කිරීමට හැකි වී ඇත. එසේම නුපුහුණු ශ්‍රමිකයින් වශයෙන් කර්මාන්ත ක්ෂේත්‍රයට පිවිසීමේ අවාසිය ද ගුණාත්මක හා ජාතික මෙන්ම ජාත්‍යන්තරව ද පිළිගත් NVQ සහතිකයක් ලබාගැනීමේ වැදගත්කම තරුණ ප්‍රජාවට මෙන්ම උපයාගත් වෘත්තීය හැකියාවන් සහිත ශ්‍රමිකයන්ට ද පෙන්වා දීම සඳහා Derana Skills Force, Skills Expo, Future Skills වැනි වෘත්තීය අධ්‍යාපන ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීමට මේ වසර තුළ ක්‍රියා කර ඇත.

ඒ අනුව 2023 දෙසැම්බර් 31 දක්වා කාලය කාලය තුළ, අධ්‍යාපන අමාත්‍යාංශයේ නිපුණතා සංවර්ධන හා වෘත්තීය අධ්‍යාපන අංශය යටතේ ඇති වෘත්තීය පුහුණු ආයතන 9ක් තුළ පුහුණුව ලද 71,414කට NVQ සහතික පිරිනමා ඇත. පුහුණු මධ්‍යස්ථාන 1410ක් දෙසැම්බර් 31 දිනට සක්‍රීයව පවතින අතර නව විෂයමාලා 55ක් තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් සංවර්ධනය කර ඇත. ඒ අනුව සක්‍රීයව පවත්නා විෂයමාලා සංඛ්‍යාව 447කි. ඒ ආශ්‍රයෙන් පුහුණු ආයතන මඟින් පවත්වන පාඨමාලා සංඛ්‍යාව 3000ක් පමණ වේ. ඒ අනුව මේ වසර සඳහා සමස්ත ශිෂ්‍ය ඇතුළත්වීමේ ඉලක්කය වූ 122,254ට සාපේක්ෂව 2023 දෙසැම්බර් 31 දිනට ඇතුළු වී සිටින ශිෂ්‍ය සංඛ්‍යාව 120,255කි.

මේ අතරතුර අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රතිව්‍යුහකරණයකට අවශ්‍ය ප්‍රතිපත්ති සකස් වෙමින් පවතී. ඊට වෘත්තීය අධ්‍යාපනය ද අදාළ වේ. එම පසුබිම තුළ වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රය සඳහා වෙන්වන ප්‍රතිපාදන ප්‍රමාණය වාර්ෂික අයවැය තුළ 2.5%ක් තරම් කුඩා වන අතර එයද ඵලදායකව යෙදවෙන්නේද යන ප්‍රශ්නය රාජ්‍ය වියදම් සමාලෝචන කමිටුව විසින් ඉදිරිපත් කළ වාර්තාව මඟින් ප්‍රශ්න කර ඇති අතර ආයතන පරිපාලනයේ වෙනසක් ද රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වයක් හා පාඨමාලා සඳහා ගාස්තු අයකිරීම් ක්‍රමයක් ද නිර්දේශ වී ඇත. වෘත්තීය පුහුණු අධිකාරිය හා ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය මේ වනවිටත් පාඨමාලා ගාස්තු ක්‍රමයක් හඳුන්වා දී ඇති අතර ස්වයං උපායගැනීම් තුළින් කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු ක්ෂේත්‍රය තිරසර සංවර්ධනයක් කරා ගමන් කිරීමට අවශ්‍ය පසුබිම සකස් වෙමින් පවතී.

පර්යේෂණ හා නව නිපැයුම් අංශය මඟින් 2023 වර්ෂය සඳහා එම අංශය වෙත වෙන් කරන ලද ප්‍රතිපාදන කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස භාවිතා කරමින්, රටෙහි වර්තමානයේ උද්ගතව ඇති අර්බුදයන්ට විසඳුම් ලබා

දීම සඳහා තම විෂය පථය යටතේ පවත්නා ආයතන ද මෙහෙයවමින් විවිධ වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කරන ලදී. පර්යේෂණයන් තෝරා ගැනීම, මෙහෙයවීම හා කළමනාකරණය වෙනුවෙන් විධිමත් ක්‍රියා පටිපාටීන් ස්ථාපිත කිරීම, රටෙහි ආර්ථික වර්ධනය උදෙසා නිර්මාණශීලීත්වය, නව නිපැයුම් හා නවෝත්පාදනයන්හි වැදගත්කම පිළිබඳව පාසැල් ප්‍රජාව සහ මහජනතාව දැනුවත් කිරීම, විද්‍යාව ප්‍රචලිත කිරීමේ වැඩසටහන් සහ ජාත්‍යන්තර පර්යේෂණ සහයෝගීතාවයන් වර්ධනය හා දැනුම හුවමාරු වැඩසටහන් ක්‍රියාත්මක කරවීම ඒ අතරට ගැනේ.

විද්‍යාව ප්‍රචලිත කිරීමේ වැඩසටහන යටතේ ප්‍රමුඛතම කාර්යය ලෙස ශ්‍රී ලාංකීක ප්‍රජාවගේ විද්‍යා දැනුම වර්ධනය කිරීමේ අභිලාෂයෙන් ලෝක විද්‍යා දිනයට සමගාමීව ජාතික විද්‍යා දිනය හා විද්‍යා සතිය සැමරීමේ ප්‍රදර්ශනයක් 2023.11.07 වන දින සිට 10 වන දින දක්වා කොළඹ ජාතික ස්වභාවික විද්‍යා කෞතුකාගාර පරිශ්‍රයේ දී පවත්වන ලදි.

විද්‍යාව පිළිබඳ අන්තර්ජාතික සහයෝගීතාවයන් වර්ධනය වෙනුවෙන් මෙම වසරේ දී විශේෂ අවධානයක් යොමු කළ අතර ඉන්දු-ශ්‍රී ලංකා විද්‍යා හා තාක්ෂණ සහයෝගීතාවය යටතේ දෙරටෙහිම වාණිජමය කර්මාන්තයක් වන උක් වගාවේ දී මුහුණ දීමට සිදුවන ගැටළු විසඳීම සඳහා උපායමාර්ගික ක්‍රමවේදයක් සකසන ලදී.

රටෙහි බලශක්ති අර්බුදයට පිළියමක් සෙවීමේ අරමුණින් අමාත්‍යාංශ අධීක්ෂණය යටතේ 2017 වර්ෂයේ දී අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත ආරම්භ කරන ලද සූර්ය පැනල මූලාකෘති නිෂ්පාදනය සඳහා පහසුකම් සැපයීමේ හා අධ්‍යාපනික පුහුණු වැඩසටහන් ව්‍යාපෘතිය 2023 වර්ෂයේ දී සාර්ථකව නිම කරන ලදි. ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් කර ගනිමින් ශ්‍රී ලංකාවේ වෘත්තීය අධ්‍යාපනයට නව ක්ෂේත්‍රයක් හඳුන්වාදෙමින් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය (SLSEA) හා ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (NAITA) යන ආයතන සමඟ සහයෝගීතාවයෙන් සූර්ය බලශක්ති කාර්මික ශිල්පී පුහුණුව ආරම්භ කළ අතර මේ වනවිට NVQ Level 3 හා 4 මට්ටමේ ශිල්පීන් 84ක කණ්ඩායමක් පුහුණුව ලබා ඇත. සූර්ය බලශක්ති හා භාවිතයන් පිළිබඳව පාසැල් සිසුන් හා ගුරුවරුන් දැනුවත් කිරීම දෙවන කාර්යය වූ අතර දිවයින පුරා පවත්වන ලද පාසැල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් හා අමාත්‍යාංශය විසින් පවත්වන ලද විද්‍යා ප්‍රදර්ශනයේ දී සාක්ෂාත් කරගන්නා ලදි. ව්‍යාපෘතියේ ප්‍රමුඛ කාර්යය වූ සූර්ය පැනල මූලාකෘති නිෂ්පාදනය පිළිබඳ පර්යේෂණ සංවර්ධනය හා පුහුණුව යටතේ MPhil / PhD උපාධිධාරීන් 05ක් බිහිකරමින් වාණිජකරණය සඳහා යෝග්‍ය මට්ටමේ සූර්ය පැනල මූලාකෘති 12ක් පර්යේෂණාගාර මට්ටමින් නිෂ්පාදනය කොට ඇත.

ජෛව පොහොර වර්ග වැඩිදියුණු කිරීම සහ පාංශු කළමනාකරණය හරහා නිසරු වූ බිම් සාරවත් භාවයට පත්කිරීම යටතේ ජෛව පටල ජෛව පොහොර (BFBF) ව්‍යාපෘතියෙහි ක්ෂේත්‍ර පර්යේෂණ කටයුතු තවදුරටත් පුළුල් කර නියමු ව්‍යාපෘති ක්‍රියාත්මක කරවන ලද අතර මේ මඟින් රසායනික පොහොර භාවිතය අවම කිරීමට කටයුතු කර ඇත.

මෑතකදී ස්ථාපිත කරන ලද ශ්‍රී ලංකා ඉන්ස්ටිට්යුට් ඔෆ් බයෝටෙක්නොලොජි (Sri Lanka Institute of Biotechnology) විසින් දේශීය අරමුදල් මෙන්ම විදේශාධාර මඟින් විද්‍යාගාර පහසුකම් තවදුරටත් පුළුල් කරගනිමින් ජෛව තාක්ෂණික ක්ෂේත්‍රයේ දැනුම වර්ධනය සහ පරීක්ෂණයන් පුළුල්කර ඇත. තව ද ජාන සහ ඉංජිනේරු ජෛව තාක්ෂණය පිළිබඳ ජාත්‍යන්තර මධ්‍යස්ථානය (ICGEB) සමඟ අවබෝධතා ගිවිසුමක් ඇතිකර ගනිමින් දකුණු ආසියානු කලාපීය පර්යේෂණ මධ්‍යස්ථානය බවට පත්විය. ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය නැනෝ තාක්ෂණය හා උසස් තාක්ෂණික පර්යේෂණයන් හා සංවර්ධන කටයුතු පුළුල් කරමින් රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය යටතේ 2023 වර්ෂයේ දී ආදායම් උත්පාදනය අරමුණු කරගනිමින් නව පර්යේෂණයන් පහක් ආරම්භ කරන ලදි.

ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරය මහජනතාව වෙත තම සේවාවන් ලබා දෙමින් රුපියල් මිලියන 22කට වැඩි ඉහළ ආදායමක් ඉපයීමට සමත් විය.

1.2.

දැක්ම

නිපුණත්වයෙන් සපිරි පර්යේෂණශීලී නවෝත්පාදක සමාජයක්


මෙහෙවර

දැනුමෙන්, වෘත්තීය නිපුණත්වයෙන් සහ කුසලතාවයෙන් පිරි සුහුරු සමාජයක් බිහි කිරීම සහ පර්යේෂණ හා නවෝත්පාදන ප්‍රවර්ධනයට හිතකර පරිසර පද්ධතියක් නිර්මාණය කිරීම මඟින් කලාපීය නව නිපැයුම් කේන්ද්‍රස්ථානයක් සඳහා පසුබිම සැකසීම.

1.3. ප්‍රධාන කාර්යයන්

- වෘත්තීය අධ්‍යාපනය සඳහා ඇති නැඹුරුව ඉහළ නැංවීම සඳහා ක්‍රමෝපායන් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- අධ්‍යාපන සුදුසුකම් නොසලකා වෘත්තීය අධ්‍යාපනය ලබා ගැනීමට අවස්ථා ඇති කිරීම.
- දේශීය හා විදේශීය රැකියා වෙළඳපොළට උචිත ශ්‍රම බලකායක් නිර්මාණය කිරීම සඳහා කාර්මික හා තාක්ෂණ අධ්‍යාපනය නවීකරණය කිරීම.
- වෘත්තීය විෂයමාලා නවීකරණයක් කොට,One TVET සංකල්පය යටතේ අදාළ ආයතන ජාලගත කර, තාක්ෂණවේදී උපාධි ආයතන බවට පත් කිරීම.
- පාසැල් අධ්‍යාපනය හැරයාමෙන් පසු විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා සුදුසුකම් නොලබන සිසුන්ට වෘත්තීය අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීමට හැකිවන පරිදි ප්‍රතිපත්ති සැකසීම හා පහසුකම් සැපයීම.
- ආධුනිකත්ව පුහුණු අවස්ථා ප්‍රවර්ධනයට පියවර ගැනීම.
- දැනට පවත්නා ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම් තල 7 සිට තල 10 දක්වා වැඩි කිරීම හා ඊට අනුරූපව ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව (SLQF) සංශෝධනය කිරීම.
- වෘත්තීය අධ්‍යාපන පාඨමාලාවන්ට ව්‍යවසායකත්වය, තොරතුරු තාක්ෂණය, ඉංග්‍රීසී සහ අනෙකුත් භාෂා ඇතුළත් කරමින් විෂයමාලා සංශෝධනයක් සිදු කිරීම.
- ජංගම තාක්ෂණික අධ්‍යාපන සේවා මඟින් වෘත්තීය පුහුණු අවස්ථා පුළුල් කිරීම.
- දේශීය හා විදේශීය රැකියා වෙළඳපොළ ඉලක්ක කරගත් වෘත්තීය අධ්‍යාපනයක් ලබාදීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- ජාත්‍යන්තර පර්යේෂණ ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම සඳහා පර්යේෂණ ආයතනවලට පහසුකම් සැපයීම.
- නවෝත්පාදන හා පර්යේෂණ ප්‍රතිඵල ප්‍රයෝජනයට ගැනීම සඳහා කාර්යක්ෂම යාන්ත්‍රණයක් සකස් කිරීම.
- ජාතික නවෝත්පාදන ආයතනය පිහිටුවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- විද්‍යාත්මක, කාර්මික හා සමාජ, ආර්ථික පර්යේෂණ හා සංවර්ධන කටයුතු පුළුල් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- නව සොයාගැනීම් සඳහා ප්‍රජාව යොමු කිරීම සහ පෙළඹවීම.

1.4. සංවිධාන ව්‍යුහය



1.5. නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් අංශය යටතේ ක්‍රියාත්මක දෙපාර්තමේන්තු

- කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

1.6. නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් අංශය යටතේ ක්‍රියාත්මක ආයතන

- තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC)
- ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය (NAITA)
- ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය (VTASL)
- ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය (CGTTI)
- වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය (UNIVOTEC) හා ඒ යටතේ ක්‍රියාත්මක විශ්වවිද්‍යාල විද්‍යාතන
- ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය (OCUSL)
- ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය (NIBM)
- ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව විද්‍යායතනය (NSBM)
- සී/ස නිපුණතා සංවර්ධන අරමුදල (SDFL)
- නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී.ක්ලාක් ආයතනය (ACCIMT)
- ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව (NASTEC)
- ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය (NERDC)
- ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය (NIA)
- ජාතික මූලික අධ්‍යයන ආයතනය (NIFS)
- ජාතික පර්යේෂණ සභාව (NRC)
- ජාතික විද්‍යා පදනම (NSF)
- ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් බයෝටෙක්නොලොජි (SLIBTEC)
- ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම (SLIC)
- ශ්‍රී ලංකා නිනිති තාක්ෂණ ආයතනය (පෞද්) සමාගම (SLINTEC)
- ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරය (PLANETARIUM)

1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල විස්තර

ව්‍යාපෘතියේ නම	දායක නියෝජිතායතනය	ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු ගත වියදම (මිලියන)	ව්‍යාපෘති කාල සීමාව
අන්තර්ගෘහිත ආර්ථික වර්ධනයක් සඳහා නිපුණතා ව්‍යාපෘතිය (Skills for Inclusive Economic Growth Program (S4IG)	ඕස්ට්‍රේලියානු රජය	ඕස්ට්‍රේලියානු ඩොලර් 12	2022 මාර්තු සිට 2025
ජර්මානු රජයේ ආධාර මත ක්‍රියාත්මක වෘත්තීය පුහුණු වැඩසටහන (GIZ)	ජර්මන් රජය	යූරෝ 7	2020 ජූලි සිට 2023
ජර්මානු රජයේ ආධාර මත ක්‍රියාත්මක වෘත්තීය පුහුණු වැඩසටහන (GIZ) 11 පියවර	ජර්මන් රජය	යූරෝ 7	2023 සිට 2026
YouLead ව්‍යාපෘතිය	ඇමරිකා එක්සත් ජනපදය	ඇමරිකානු ඩොලර් 06	2021 සිට 2024
ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන (SSDP)	ආසියානු සංවර්ධන බැංකුව / ලෝක බැංකුව/ ශ්‍රී ලංකා රජය	ඇමරිකානු ඩොලර් 398.41	2014 සිට 2023 ජූනි
කාර්මික විද්‍යාල සහ තාක්ෂණ විද්‍යාලවල ඉදිකිරීමේ පාඨමාලා සඳහා ධාරිතා සංවර්ධන ව්‍යාපෘතිය	KOICA	ඇමරිකානු ඩොලර් 4	2020 -2024
TVET Carrer Platform Project	KOICA	ඇමරිකානු ඩොලර් 6	2022-2026
Strengthening Vocational Training Centre at Niyagama	HRD Korea	කොරියානු වොන් 2150	2023-2024

පරිච්ඡේදය 02
ප්‍රගතිය සහ ඉදිරි දැක්ම

2.1. නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් අංශයේ 2023 වසරේ ජයග්‍රහණයන්

2.1.1 නිපුණතා සංවර්ධන හා වෘත්තීය අධ්‍යාපන අංශය

- **අයවැය යෝජනා යටතේ ක්‍රියාත්මක වැඩසටහන්වල ප්‍රගතිය**

පෙර වර්ෂවල ඉදිරිපත් වූ අයවැය යෝජනාවලට යටත්ව විවිධ නිපුණතා සහිත තරුණ ශ්‍රමිකයන් සඳහා පවතින විශාල ඉල්ලුමට සරිලන පරිදි අවශ්‍යතාවයන් හා ඌණතාවයන් සපුරාලීම සඳහා පහත සඳහන් විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

- ශ්‍රම වෙළඳපොළේ ඉහළ ඉල්ලුමක් සහිත පාඨමාලා සඳහා සිසුන් බඳවාගැනීම් ඉහළ නැංවීම පිණිස අමාත්‍යාංශය විසින් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට තීරණය කරන ලදී. ඒ අනුව 2021 වර්ෂයේදී පන්ති කාමර, වැඩහල්, විද්‍යාගාර, ආපනශාලා, විවේකාගාර, ඇඳුම් මාරු කිරීමේ කාමර, සනීපාරක්ෂක ඒකක සහ ශිෂ්‍ය, ගුරු නිල නිවාසවල අලුත්වැඩියා කටයුතු සහ වැඩිදියුණු කිරීම් සිදු කිරීම ආරම්භ කරන ලදී. මෙහිදී 2023 වර්ෂයට අදාළ අවිච්ඡේද ව්‍යාපෘති 10 සඳහා ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය සහ ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය වෙත රු.මි. 41.33 ප්‍රතිපාදන වෙන් විය. මෙහි දී සිදු වූ මිල විවිධත්වයන් සඳහා ප්‍රසම්පාදන කමිටු තීරණ ප්‍රමාද වීම හේතුවෙන් රු.මි. 2.85ක මූල්‍ය ප්‍රගතිය පමණක් අත්කර ගන්නා ලදී.

- තරුණ පරපුර වෘත්තීය පුහුණුව සඳහා ආකර්ෂණය කර ගැනීමට ටෙක් උදාන වැඩසටහන යටතේ කාර්මික විද්‍යාල හා තාක්ෂණික විද්‍යායතනවල ඒකීය ගෘහ නිර්මාණ ශිල්පීය ආකෘතියක් යටතේ සංවර්ධන කටයුතු සිදු කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත. ඒ යටතේ 2021 වසරේ ආරම්භ කළ මහනුවර, කුරුණෑගල, මරදාන තාක්ෂණ විද්‍යායතනය සහ හෝමාගම, දඹුල්ල, මාතර කාර්මික විද්‍යාලවල ව්‍යාපෘතීන් අඛණ්ඩව ඉටු කරමින් පවතී. මාතර කාර්මික විද්‍යාලයේ සහ මරදාන තාක්ෂණ විද්‍යායතනයේ ඉදි කිරීම් කටයුතු ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් ඉටු කරනු ලබයි. 2023 වර්ෂයේ මෙම වැඩසටහන සඳහා රු.මි.300ක ප්‍රතිපාදන වෙන් වූ අතර 2023.12.31 දිනට වියදම රු.මි. 87.25වේ. සමස්ත භෞතික ප්‍රගතිය 65%කි.

- නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන අංශය යටතේ ක්‍රියාත්මක නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන (SSDP) මඟින් 2014 - 2018 කාලය තුළ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය හා ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය යන ආයතනවල වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 11ක බිම් මහල පමණක් ඉදිකර, අර්ධව නිමකරන ලද (50%) ගොඩනැඟිලි පවතී. මෙම ගොඩනැඟිලි වෙත සෘජු හිරු එළිය හා වර්ෂාපතනය හේතුවෙන් සිදුවන හානි වළක්වා ගැනීම සඳහාත් පහළ මාලයේ පුහුණුව ලබන සිසුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහාත් මෙම ඉදිකිරීම් සම්පූර්ණ කළ යුතුව ඇත. ඒ අනුව ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරියෙහි ගොඩනැඟිලි 4ක සහ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ ගොඩනැඟිලි 7ක උඩු මහල ඉදිකර සම්පූර්ණ වැඩ නිම කිරීමට (ඉතිරි 50%) ආයතනය විසින් සකස් කළ ඇස්තමේන්තු වියදම රු.මි. 870කි. 2023 - 2025 කාල පරිච්ඡේදය තුළ අදියර කිහිපයකදී මෙම සියළු ගොඩනැඟිලිවල වැඩ අවසන් කිරීම සඳහා සැලසුම්කළ මුත් ලැබී ඇති ප්‍රතිපාදන මුදල ඉදිකිරීම් ක්ෂේත්‍රයේ වත්මන් තත්වය හා අක් මුදල් ලබා ගැනීමට ඇති හැකියාව ආදී කරුණු සැලකිල්ලට ගෙන ජාතික මෙහෙයුම් මැදිරියෙහි (NOR) තීරණය පරිදි ගොඩනැඟිලි 6ක් සඳහා ආරක්ෂිත වහල පමණක් ඉදි කිරීමට මේ වනවිට අවශ්‍ය කටයුතු සම්පාදනය කරමින් පවති

➢ කාර්මික හා වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ **2023.12.31** දිනට ප්‍රගතිය

- ගෝලීය ශ්‍රම වෙළඳපල ප්‍රවණතා මෙන්ම ශ්‍රී ලාංකීය තරුණ ප්‍රජාවගේ තත්කාලීන රැකියා ඉල්ලුම පිළිබඳ විශේෂ අවධානය යොමු කරමින්, විදේශ රැකියා ක්ෂේත්‍රය සබැඳිව කටයුතු කරනු ලබන අනෙකුත් අමාත්‍යාංශ, රාජ්‍ය හා පෞද්ගලික ආයතන සම්බන්ධීකරණය කරමින්, බහුවිධ ප්‍රවේශයකින් වෘත්තීය පුහුණු ආයතන මෙහෙයවමින් වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම. මේ යටතේ විදේශ රැකියා වෙළඳපල වෙත ගුණාත්මකභාවයෙන් යුත් විදෙස් ශ්‍රම බලකායක් සැපයීම අරමුණු කරගනිමින් කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය, විදේශ කටයුතු අමාත්‍යාංශය, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය හා සෞඛ්‍ය අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධ අන්තර් අමාත්‍යාංශ ඒකාබද්ධ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට පියවර ගැනීම. මේ හරහා ශ්‍රමිකයින් සඳහා ඉල්ලුම ඇති රටවල් සමඟ නිපුණතා සම්මත ගැලපීම් හා අවබෝධතා ගිවිසුම්වලට එළැඹීම, තත්කාලීන ගෝලීය ශ්‍රම වෙළඳපල ප්‍රවණතා හා ඉහළ රැකියා ඉල්ලුම් සහිත ක්ෂේත්‍ර පිළිබඳ තොරතුරු වෘත්තීය පුහුණු ආයතන වෙත ලබා ගැනීම සම්බන්ධීකරණය, විදේශ සේවා නියුක්ත කාර්යාංශය, විදේශ තානාපති කාර්යාල සමඟ ශක්තිමත් සම්බන්ධීකරණයක් ගොඩ නැගීම වැනි ක්‍රියාකාරකම් ආරම්භ කර ඇත.

- ජපන් රජය හා ශ්‍රී ලංකා රජය අතර 2019 අප්‍රේල් මස 01 වන දින අත්සන් තබන ලද අවබෝධතා ගිවිසුම අනුව ජපන් රජය විසින් ලබාදී ඇති විශේෂිත නිපුණ ශ්‍රමික (Specified Skilled Worker) වැඩසටහන ඉලක්ක කර ගනිමින් ආරම්භ කරන ලද ජපන් භාෂා පාඨමාලා හා වෘත්තීය පුහුණු පාඨමාලා, වෘත්තීය පුහුණු ආයතන මඟින් පවත්වාගෙන යනු ලැබේ. එම පාඨමාලා සාර්ථකව අවසන් කරන ලද පුහුණුලාභීන්ගේ තොරතුරු අවශ්‍ය ඉදිරි කටයුතු සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙත යොමු කර ඇත.

- විදේශ රැකියා අවස්ථා ඉලක්ක කරගනිමින් ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය හරහා පාඨමාලා 17ක් ඔස්සේ පුහුණුලාභීන් 1,504 දෙනෙකු, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය හරහා පුහුණුලාභීන් 191 දෙනෙකු සහ කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව හරහා පාඨමාලා 6ක් ඔස්සේ පුහුණුලාභීන් 3,860 දෙනෙකු පුහුණුව ලබා ඇත.

- ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ මූලිකත්වයෙන් සිදු කෙරෙන ශ්‍රී ලාංකික NVQ සුදුසුකම්ලාභීන් සඳහා සිංගප්පූරුවේ ඉදිකිරීමේ ක්ෂේත්‍රයේ රැකියා අවස්ථා ලබා දීමේ වැඩසටහන, ශ්‍රී ලාංකිකයින් සඳහා කොරියාවේ පවතින නැව් ඉදිකිරීමේ ක්ෂේත්‍රයේ රැකියා අවස්ථා ලබා දීමේ වැඩසටහන, ශ්‍රී ලාංකිකයින් සඳහා බහරේනයේ සත්කාරක (Hospitality) ක්ෂේත්‍රයේ ආධුනික අවස්ථාවන් ලබා දීමේ වැඩසටහන හා ශ්‍රී ලාංකික හෙදියන් සහ සාත්තු සේවකයින් සඳහා බෙල්ජියමේ රැකියා අවස්ථා ලබා දීමේ වැඩසටහන යනාදී වූ විදේශ රැකියා ඉලක්ක කරගත් වැඩසටහන් සඳහා පුහුණුලාභීන් යොමු කිරීමට වෘත්තීය පුහුණු ආයතන වෙත මඟ පෙන්වීම.

- පාසැල් අධ්‍යාපනය අවසන් කරන තරුණ ප්‍රජාව වෘත්තීය අධ්‍යාපනය සඳහා යොමු කර, ඔවුන් නඟා සිටුවීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් දෙරණ මාධ්‍ය ජාලය සමඟ එක්ව නිපුණතා බලකාය ශිෂ්‍ය මාර්ගෝපදේශන වැඩසටහන ආරම්භ කරන ලදී. මේ වන විට මරදාන, ගම්පහ, ඇඹිලිපිටිය, ගාල්ල, නුවරඑළිය, කුරුණෑගල, කළුතර කාර්මික හා තාක්ෂණ විද්‍යාලයන්හිදී සිසුන් 16,740 දෙනෙකුගේ සහභාගිත්වයෙන් එහි අදියර 7ක් සාර්ථකව සිදු කරන ලද අතර, වෘත්තීය යතුර පරීක්ෂණය සඳහා සිසුන් 8,280ක ප්‍රමාණයක් සහභාගීව වෘත්තීය මාර්ගෝපදේශනය ලබා ගැනීමටත්, ඊට අමතරව වෘත්තීය පුහුණු පාඨමාලා සඳහා සිසුන් යොමු කිරීමටත්, පෙර දැනුම ඇගයීමේ ක්‍රමය (RPL) යටතේ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) ලබා ගැනීම ප්‍රාදේශීය මට්ටමින් ප්‍රචලිත කිරීමට හා ඒ සඳහා පුද්ගලයින් ආකර්ෂණය කර ගැනීමටත් කටයුතු සිදු කර ඇත.

- පොදු ව්‍යාපාර කාරක සභා කමිටු නිර්දේශ පිළිබඳ සැලකිලිමත්ව, වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ නූතන ප්‍රවණතා සමඟ අනුගත වන ලෙස 1999 අංක 50න් සංශෝධිත 1990 අංක 20 දරණ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනත සංශෝධනය කිරීම සඳහා කටයුතු සිදු කරමින් පවතින අතර, ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබීම හේතුවෙන් ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව ක්‍රියාත්මක කිරීමට සබැඳිව ජාතික නිපුණතා කොමිෂන් සභාව ස්ථාපිත කිරීමට අදාළව සකස් කළ කෙටුම්පත මේ වනවිට ජ්‍යෙෂ්ඨ ජනාධිපති අතිරේක ලේකම් වෙත 2023.12.28 දිනැති ලිපිය මඟින් යොමු කර ඇත. මීට අමතරව, පොදු ව්‍යාපාර කාරක සභාවේ නිර්දේශයන් සලකා 1995 අංක 12 දරණ වෘත්තීය පුහුණු අධිකාරියේ පනත සංශෝධනය සඳහා වන යෝජනා සකස් කර ඇති අතර, ජාතික අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හා 2024 අයවැය කථාව සැලකිල්ලට ගනිමින් අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරගෙන යාම.

- වෘත්තීය අධ්‍යාපනයට යොමු වන ශිෂ්‍ය සංඛ්‍යාව දෙගුණ කරමින් තරුණ ප්‍රජාව සඳහා වෘත්තීය පුහුණු අවස්ථා පුළුල් කිරීම අරමුණු කරගෙන වෘත්තීය පුහුණුවේ යෙදෙන සිසුන් සඳහා ක්‍රියාත්මක වන "නිපුණතා සිසු සවිය" ශිෂ්‍යාධාර වැඩසටහන යටතේ 2023 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් මස දක්වා කාල සීමාව තුළ සිසුන් 24,812 සඳහා රුපියල් මිලියන 385.8ක ශිෂ්‍යාධාර ලබාදී ඇත.

- කිලිනොච්චි ශ්‍රී ලංකා ජර්මානු පුහුණු ආයතනය (SLGTI) සඳහා සුදුසු නෛතික රාමුවක් සකස් කිරීම සඳහාවූ ක්‍රියාවලියේදී එම යෝජනාව සලකා බැලීමෙන් පසුව SLGTI ආයතනය, ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ (CGTTI) මධ්‍යස්ථාන ශාඛාවක් ලෙස පවත්වාගෙන යාම සඳහා 2023.01.31 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ලැබී ඇත. ඒ අනුව, 2022 වර්ෂයේදී GIZ ව්‍යාපෘතිය යටතේ සකස් කළ පාසැල් සංවර්ධන සැලැස්ම ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කර ඇත. තවද, කිලිනොච්චි ශ්‍රී ලංකා ජර්මානු පුහුණු ආයතනය (SLGTI) සම්බන්ධයෙන් අපේක්ෂිත අධ්‍යයන හා පරිපාලන අරමුණු නිසි පරිදි ඵලදායීව පවත්වාගෙන යාම සඳහා GIZ Vocational Training in Sri Lanka ව්‍යාපෘතිය යටතේ ජර්මානු විශේෂඥයෙකුගේ සහාය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලදී.

- ජර්මානු ෆෙඩරල් ජනරජය යූරෝ මිලියන 7.6ක ප්‍රදානය යටතේ 2019 වර්ෂයේ සිට GIZ ආයතනය හරහා GIZ - VTSL ව්‍යාපෘතිය ක්‍රියාත්මක වූ අතර, එමඟින් කර්මාන්තගත සහයෝගීත්ව ප්‍රවේශයෙන් සිසුන් 368ක් සඳහා පුහුණුව ලබාදී ඇත. තවද, නිපුණ ශ්‍රමික වැඩසටහන් සඳහා පෞද්ගලික අංශයේ කර්මාන්ත 18ක සහය ලබා ගෙන ඇති අතර විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සහ සමාජීය ආන්තික තත්වයට පත් පුද්ගලයින් සඳහා සුදුසුකම් මිණුම් (Qualification Measures) 40ක් ක්‍රියාත්මක කිරීම. වෘත්තීය පුහුණු ආයතනවල නිලධාරීන් 516ක් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරමින් 2023 වර්ෂයේ මැයි මාසයේ මෙම ව්‍යාපෘතිය සාර්ථකව නිම කර ඇත. තවද, ජර්මානු ෆෙඩරල් ජනරජයේ යටතේ යුරෝ මිලියන 7 ප්‍රදානය යටතේ VTSL Phase II නව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට යෝජිත අතර ඒ සඳහා කෙටුම්පත් කරන ලද ක්‍රියාකාරී ගිවිසුම (Implementation Agreement) අත්සන් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට 2023.12.14 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරන ලද අතර ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි වී ඇත.

- ඕස්ට්‍රේලියානු රජයේ ආධාර වැඩසටහන යටතේ ලද ඕස්ට්‍රේලියානු ඩොලර් මිලියන 12ක මූල්‍ය ප්‍රදානයක් මත ආරම්භ කළ අන්තර්ගෘහිත ආර්ථික වර්ධනයක් සඳහා නිපුණතා ව්‍යාපෘතියේ (S4IG) දෙවන අදියර යටතේ VTA, NAITA සහ TVEC ආයතන සමඟ එක්ව මුළු දිවයින පුරා සංචාරක ක්ෂේත්‍රයේ අගයදාමයන් ප්‍රවර්ධනය හා විශේෂ අවශ්‍යතා සහිත ආන්තික ප්‍රජාව ප්‍රමුඛ කර ගනිමින් වෘත්තීය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- වැඩහල්වල වෘත්තීය පුහුණුව ලබන සිසුන් සඳහා ආරක්ෂිත ඇඳුම් කට්ටල (Overall Kit) ලබා දීමේ වැඩසටහන යටතේ ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය, ජාතික ආධුනිකත්ව හා පුහුණු කිරීමේ අධිකාරිය, කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව, ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය,

වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය හා ඊට අනුබද්ධ විශ්වවිද්‍යාල විද්‍යායතනයෙහි පුහුණුව ලබන සිසුන් වෙත ආරක්ෂක ඇඳුම් කට්ටල 11,902ක් ලබා දීම සඳහා ඇණවුමක් යුධ හමුදාවේ රණවිරු ඇපරල් ආයතනය වෙත ලබා දී ඇති අතර, 2023.12.31 දින විට එම ආයතනය මඟින් ලබා දෙන ලද ඇඳුම් කට්ටල 4702ක ප්‍රමාණය වෘත්තීය පුහුණු ආයතන වෙත ලබා දී ඇත. රණවිරු ඇපරල් ආයතනය විසින් ඉතිරි ඇඳුම් කට්ටල 2024 ජනවාරි මාසයේදී ලබා දී ඇති අතර මේ වන විට අදාල ඇඳුම් කට්ටල වෘත්තීය පුහුණු ආයතන සඳහා නිකුත් කරමින් පවතී.

- ශ්‍රම වෙළඳපල ඉල්ලුම මත පදනම් වූ කාර්මික, වෘත්තීය අධ්‍යාපන සහ පුහුණු ක්ෂේත්‍රය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය සඳහා කොරියානු ජනරජයේ රැකියා හා කම්කරු අමාත්‍යාංශය මඟින් ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය යටතේ ක්‍රියාත්මක වන නියාගම ජාතික වෘත්තීය පුහුණු ආයතනය වැඩි දියුණු කිරීම හා එහි ධාරිතා සංවර්ධනය කිරීම සඳහා කොරියානු වොන් බිලියක 2.15ක ආධාරයක් ලබා දීමට එකඟ වී ඇති අතර, එම ව්‍යාපෘතිය සඳහා යෝජිත ගිවිසුම අත්සන් කිරීම හා ධාරිතා සංවර්ධනය කිරීම වෙනුවෙන් කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු ක්ෂේත්‍රයේ (TVET) විශේෂඥයින්ට හා උපදේශකවරුන්හට පුහුණුවීම් ලබාදීම හා උපකරණ ලබාදීමට අදාළ කටයුතු ආරම්භ කර ඇත.

- ශ්‍රී ලංකා කොරියානු ජාතික වෘත්තීය පුහුණු ආයතනය (K-TEC)හි දැනට පවතින පහසුකම් තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා ශ්‍රී ලංකා රජයේ ඉල්ලීම සලකා බැලීමෙන් පසු කොරියානු ආනයන හා අපනයන බැංකුව (EXIM Bank) විසින් ඇමරිකානු ඩොලර් මිලියන 1.5ක ප්‍රදානයක් සමඟින් ඔරුගොඩවත්ත K-TEC ආයතනය සඳහා පසු නිම කිරීමේ සහාය ලබා දීමේ ව්‍යාපෘතිය (Post Completion Support to Sri Lanka Korean National Training Institute (K-TEC) සඳහා අවබෝධතා ගිවිසුම (MoU) කෙටුම්පතක් ඉදිරිපත් කර ඇත. අදාළ කෙටුම්පත සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ හා නීතිපති දෙපාර්තමේන්තුවේ නිර්දේශ ලැබී ඇති අතර අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට නියමිතය.

- ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ශ්‍රම වෙළඳපල ඉල්ලීම් සපුරාලන උසස් තත්වයේ තාක්ෂණික, වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව මඟින් රැකියාගත කිරීම් වැඩි කිරීමේ අරමුණින් "ශ්‍රී ලංකාවේ කාර්මික විද්‍යාල සහ තාක්ෂණ විද්‍යාලවල ඉදිකිරීම් පාඨමාලා සඳහා ධාරිතා වර්ධන ව්‍යාපෘතිය" යටතේ ඇමරිකානු ඩොලර් මිලියන 4ක ප්‍රදානයක් කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය (KOICA) විසින් ලබා දී ඇති අතර, ඒ අනුව මරදාන හා රත්නපුර තාක්ෂණ විද්‍යාලවල සහ රත්මලාන හා මාතර කාර්මික විද්‍යාලවල ඉදිකිරීම් පාඨමාලාවල ධාරිතාව වර්ධනය කිරීම. මේ යටතේ එම කාර්මික විද්‍යාලවල කර්මාන්තයේ ඉල්ලුමට සරිලන සේ පුහුණුව, යන්ත්‍රෝපකරණ, වැඩහලවල් හා පාඨමාලා නවීකරණය ආදී පහසුකම් වැඩිදියුණු කර ධාරිතාව වර්ධනය කිරීමට කටයුතු කර ඇත.

- ඇමරිකානු ඩොලර් මිලියන 6ක මූල්‍ය ආධාර මත ආරම්භ කළ "TVET Career Platform" ව්‍යාපෘතිය මඟින් TVET ක්ෂේත්‍රයේ සිසුන්ගේ රැකියාගතවීමේ නිපුණත්වයන් ප්‍රවර්ධනය කිරීම සහ ශ්‍රම වෙළඳපලේ රැකියාවන් පිළිබඳ ඔවුන්ට මාර්ගෝපදේශනය ලබා දීමේ කටයුතු සිදු කරයි. ඒ අනුව, වෘත්තීය පුහුණුව ලබා දෙන ආයතන නිරීක්ෂණය කිරීමෙන් පසු මෙම ව්‍යාපෘතියේ පළමු අදියර සඳහා ආයතන 70ක් තෝරා ගන්නා ලදී. එසේම, මෙම ව්‍යාපෘතියේ මූලික සැලැස්ම (Master Plan) සකස් කිරීම මේ වනවිට අවසන් කර ඇති අතර, Software Development කිරීම ආරම්භ කර ඇත.

- YouLead ව්‍යාපෘතිය හරහා වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශන පුහුණු වැඩසටහන් සිදු කර ඇති අතර, එහි ප්‍රතිලාභීන් සංඛ්‍යාව 39,683ක් විය. එසේම, පුහුණුකරුවන් 517 දෙනෙකු සඳහා පුහුණු අවස්ථා ලබා දෙන ලදී. තවද, ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහන් මඟින් 1,680 දෙනෙකු සඳහා ව්‍යවසායකත්ව කුසලතා වර්ධනය කිරීමට වැඩසටහන් පවත්වා ඇත.

- කොරියන් ආධාර යටතේ පහසුකම් සහිත විශ්වවිද්‍යාල පරිශ්‍රයක් ඉදිකිරීමට අදාළ ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ "අධ්‍යයන හා පර්යේෂණ ධාරිතාව වර්ධනය සඳහා සහනදායී ණය පහසුකම් ලබා ගැනීමේ ව්‍යාපෘතිය - කොරියානු ආර්ථික සංවර්ධන සහයෝගීතා අරමුදල (EDCF)" සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2023.01.16 දින ලැබී ඇත. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීම දේශීය සහ විදේශීය ණය පහසුකම් මත පදනම් වේ.

- ස්වයං රැකියා උත්පාදන උපණය යෝජනා ක්‍රමය (SEPI) යටතේ 2023 වර්ෂයට අදාළව ප්‍රතිලාභීන් 45ක් සඳහා රුපියල් මිලියන 33.1ක ණය නිකුත් කිරීම සිදු කර ඇත.

- පාසැල් හා වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම යටතේ දිස්ත්‍රික්ක 25 ආවරණය වන පරිදි දිවයින පුරා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත නිපුණතා සංවර්ධන නිලධාරීන්ගේ දායකත්වයෙන් පහත පරිදි වෘත්තීය පුහුණුව සම්බන්ධ දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදි.

අනු අංකය	වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන	පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව	ප්‍රතිලාභීන් සංඛ්‍යාව
1	අ.පො.ස. (සා.පෙළ) සිසුන් සඳහා	1,132	63,576
2	අ.පො.ස. (උ.පෙළ) සිසුන් සඳහා	531	19,751
3	දෙමව්පියන් දැනුවත් කිරීම සඳහා	1,643	60,478
4	රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමට අපේක්ෂිත වැඩසටහන් සංඛ්‍යාව (විදුහල්පතිවරුන්, ගුරුවරුන්,සමෘද්ධි නිලධාරීන් වැනි)	1,025	26,863
5	පාසල් හැර ගිය තරුණ තරුණියන් සඳහා	1,596	40,031
6	RPL සඳහා යොමු කිරීම		6877
7	අනෙකුත් ආයතන මඟින් පවත්වන ලැබූ දැනුවත් කිරීම	3	408
8	දුරකථන මාර්ගයෙන් සේවාවන් ලබා ගැනීම		619
9	කාර්යාලයට පැමිණ සේවාවන් ලබා ගැනීම		459
	එකතුව	**5,930**	**219,062**

- එසේම, වෘත්තීය මාර්ගෝපදේශනයට අදාලව දිවයින පුරා සේවාලාභීන්ට අවශ්‍ය සියළුම වෘත්තීය මග පෙන්වීම සිදු කර ඇත. (පොදු දුරකථනය සහ ක්ෂණික දුරකථන අංකය මඟින්) සමස්ත සේවාලාභීන් 466 දෙනෙකු මෙම සේවාව ලබා ගෙන ඇත.

- ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කර ඇති සංවර්ධන නිලධාරීන්ට අමතරව ජාතික වෘත්තීය මාර්ගෝපදේශ සහ උපදේශන මධ්‍යස්ථානය වෙත පැමිණෙන පාසල් සිසුන්, ගුරුවරුන්, දෙමාපියන්, තරුණ තරුණියන්, විශ්වවිද්‍යාල සිසුන්, රාජ්‍ය නිලධාරීන්, පෞද්ගලික අංශය, විශ්‍රාමිකයින් සහ පූජ්‍ය පක්ෂයේ සේවාලාභීන් සඳහා පුද්ගලික වෘත්තීය මාර්ගෝපදේශන සැසි පැවැත්වීම මඟින් අවශ්‍ය නිවැරදි මග පෙන්වීම සිදු කර ඇත.

- නිලධාරීන්ගේ භාවිතය සඳහා පොදු ඉදිරිපත් කිරීම් හතරක්, අ.පොෂ. (සාමාන්‍ය පෙළ) අ.පොෂ. (උසස් පෙළ) දෙමාපියන් දැනුවත් කිරීම හා රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම සඳහා සිංහල හා දෙමළ මාධ්‍යයෙන් සැකසීම සහ ඊට අදාළව ආදර්ශ පොදු ඉදිරිපත් කිරීම් ශ්‍රව්‍ය දෘෂ්‍ය වැඩසටහනක් ලෙස නිෂ්පාදනය කිරීම.

- නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන යටතේ ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ ශිෂ්‍ය නේවාසිකාගාරයේ ඉදිකිරීම් කටයුතු කටයුතු අවසන් කරන ලදී. කිලිනොච්චි හි ඉදිවන ශ්‍රී ලංකා ජර්මන් කාර්මික ආයතනයේ ශිෂ්‍ය නේවාසිකාගාර ගොඩනැගිල්ල පළමු අදියර ඉදිකිරීම් කටයුතු අවසන් කරන ලදි.

- නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන යටතේ ආරම්භ කර ඇති රැකියා සම්බන්ධ පුහුණු වැඩසටහනේ මූලික අරමුණ නව රැකියා අවස්ථාවලට උචිත නිපුණතා සංවර්ධනය සඳහා සහාය දැක්වීමට කටයුතු කිරීමයි. මෙමඟින් පුද්ගලික හා රාජ්‍ය අංශයේ අනෙකුත් පුහුණු ආයතනවල වෘත්තීය පුහුණු අවස්ථා දිරිගැන්වීමට අරමුදල් සහ පහසුකම් සපයනු ලබන අතර වැඩි ඉල්ලුමක් සහිත කර්මාන්ත අංශයන්හි රැකියා සඳහා අවශ්‍ය පාඨමාලාවලට රැකියා අපේක්ෂකයින් පුහුණු කිරීම සිදු කරයි. මෙම රැකියා සම්බන්ධ පුහුණු වැඩසටහන 2015 වසරේදී ආරම්භ කළ අතර පසුගිය වසර 5 තුළ වට 5ක් ක්‍රියාත්මක කර සාර්ථක ලෙස අවසන් කරන ලදී. මෙම කාලය තුළ පුහුණු ආයතන සමඟ පුහුණු ගිවිසුම් 104ක් අත්සන් කර ඇති අතර පුහුණුලාභීන් 8426 සාර්ථක ලෙස පුහුණුව සම්පූර්ණ කර ඇත.

- පෞද්ගලික අංශයේ ආයතනවල සේවයේ නියුතු කාර්යමණ්ඩලයේ නිපුණතාවය වැඩිදියුණු කිරීමට සහ නිපුණතා පරතරයන් අවම කිරීමේ අදහසින් නිපුණතා ඒකකයන් සහිත අර්ධකාලීන සහ සති අන්ත නම්‍යශීලී පුහුණු පාඨමාලාවන් අලුතින් හඳුන්වාදෙන ලදී. මෙම පාඨමාලා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ජාතික වෘත්තීය සුදුසුකම් ප්‍රවීණතා ඒකකය විසින් සකස් කර ඇත. නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන මඟින් මෙම පාඨමාලා පැවැත්වීම සඳහා පාඨමාලා පිරිවැයෙන් 50%ක් දරනු ලබයි. මේ යටතේ පුහුණුලාභීන් 3030 දෙනෙකු සාර්ථක ලෙස පුහුණුව අවසන් කර ඇත.

- පුහුණු වැඩසටහන්වල අදාළත්වය වැඩිදියුණු කිරීම සඳහා ඉදිකිරීම්, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ, නිෂ්පාදන සහ සංචාරක යන ප්‍රමුඛ කර්මාන්ත ආංශික නිපුණතා සභා (ISSC) හතරක් පිහිටුවා ඇත. 2023 වර්ෂයේදී කෘෂිකර්මාන්ත අංශය වෙනුවෙන් කෘෂිකර්මාන්ත ආංශික නිපුණතා සභාව ද මෝටර් රථ කාර්මික අංශය වෙනුවෙන් මෝටර් රථ කාර්මික ආංශික නිපුණතා සභාව ද පිහිටුවන ලදී.

- නිපුණතා, කුසලතා සහ කර්මාන්ත ක්ෂේත්‍රය තුල පවතින අවස්ථාවන් පිළිබඳව පෙන්වාදීම අරමුණු කර ගනිමින් නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන සහ කර්මාන්ත ආංශික නිපුණතා සභා විසින් 2023 වර්ෂයේදී ප්‍රථම වරට Skills EXPO ප්‍රදර්ශනය සාර්ථක ලෙස පවත්වන ලදී. මෙය ජාතික මට්ටමේ සම්මන්ත්‍රණයක් සහ ප්‍රදර්ශනයක් වූ අතර, එය නිපුණතා, කුසලතා සහ රැකියා අවස්ථා සම්බන්ධ ජාතික හා ජාත්‍යන්තර පාර්ශ්වකරුවන් එකම වේදිකාවකට රැගෙන ඒමට සමත් විය.අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් සහ තානාපතිවරුන්, නේවාසික අධ්‍යක්ෂවරුන්, අමාත්‍යවරුන්, රාජ්‍ය නිලධාරීන් සහ කර්මාන්ත ක්ෂේත්‍රයේ නියෝජිතයන්ගේ සහභාගීත්වයෙන් යුතුව මෙම ප්‍රදර්ශනය ආරම්භ කරන ලදී.

- මුළු දිවයිනම ආවරණය වන පරිදි වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 32ක සුහුරු පන්ති කාමර (Smart Class Room) වැඩසටහන ක්‍රියාත්මක කිරීම මෙම වසරේදී ආරම්භ කරන ලදී. ඒ අනුව මාර්ගගත අධ්‍යාපනය ලබාදීමට අවශ්‍ය උපකරණ ලබාදුන් අතර, පාඨමාලා සෑදීමට හා ශිෂ්‍යයන් මාර්ගගතව සම්බන්ධ කර ගැනීමටත් අදාළ වන (LMS) පද්ධතියක්ද හඳුන්වා දී ඇත. මෙම පද්ධතිය ප්‍රධාන කාර්යාලයට, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවට හා අමාත්‍යාංශයට අධීක්ෂණය කිරීමටද පහසුකම් සපයා ඇත.

- නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන යටතේ එක් නිමවුමක් වනුයේ කාර්මික වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයේ ව්‍යවසායකයින්ගට ඔවුන් තෝරාගත් ක්ෂේත්‍රයක ව්‍යාපාරයක් ආරම්භ කිරීම දිරිමත් කිරීමයි. Future Skills සම්මන්ත්‍රණය හා සම්මාන ප්‍රදානෝත්සවය පැවැත්වීම මඟින් මෙම ප්‍රදානලාභීන්ට තවදුරටත් සහය ලබාදීම සහ ඇගයීමට ලක් කිරීම සිදු කරන ලදී. එහිදී දක්ෂ හා ප්‍රවීණ ඇගයීම් මණ්ඩලයක් විසින් ප්‍රදානලාභීන් අතුරින්

හොඳම ව්‍යවසායකයින් තෝරාගන්නා ලදී. එසේ තෝරාගන්නා ලද ව්‍යවසායකයින්ගෙන් දැනුම, අත්දැකීම් හුවමාරුව ඇතුළු දිවයිනේ පිළිගත් ව්‍යවසායකයන් හමුවීමට අවස්ථාව ලබාදෙන ලදී.

- ආසියානු සංවර්ධන බැංකුව සහ නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන විසින් කාර්මික වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රය සඳහා උපායමාර්ගික සැලසුම 2024-2033 සකස් කරන ලදී. මෙම සැලසුම සම්බන්ධව වැඩිදුරටත් සමාලෝචනය කිරීම සඳහා ජනාධිපති කාර්යාලයේ පිහිටා ඇති කාර්මික වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ප්‍රතිසංස්කරණ කමිටුවට ඉදිරිපත් කර ඇත.

2.1.2 පර්යේෂණ හා නව නිපැයුම් අංශය

➢ **විද්‍යාව හා තාක්ෂණය ප්‍රචලිත කිරීමේ වැඩසටහන**

විද්‍යා හා තාක්ෂණික දැනුම ප්‍රවර්ධනය කරමින් පාසැල් සිසුන්, විශ්වවිද්‍යාල සිසුන් ඇතුළු ශ්‍රී ලාංකීය පුරවැසියන්ගේ විද්‍යා සාක්ෂරතාවය ඉහළ නැංවීම මෙම අමාත්‍යාංශයේ පර්යේෂණ හා නව නිපැයුම් අංශයට පැවරී ඇති සුවිශේෂී කාර්යභාරයකි. එකී කාර්යයන් සඵල කර ගැනීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන විවිධ වැඩසටහන්වල ප්‍රගතිය පහත පරිදි වේ.

- **ජාතික විද්‍යා දිනය**

"විද්‍යාත්මක සවිබල ගැන්වීම තුළින් සෞභාග්‍යය කරා" යන තේමාව මූලික කරගෙන ජාතික විද්‍යා දින ප්‍රදර්ශනය නොවැම්බර් 08/09/10 දිනයන්හි ජාතික ස්වභාවික විද්‍යා කෞතුකාගාර පරිශ්‍රයේ දී සාර්ථකව පවත්වන ලදී. අනාගත වැඩ ලොව ජයගත හැකි සිසු පරපුරක් බිහි කරගැනීමේ අභිලාෂයෙන්, ඔවුන්ට විද්‍යාව හා තාක්ෂණය කෙරෙහි උද්යෝගයක් ඇති කිරීම උදෙසා, ප්‍රධාන තේමා 09ක් මුල් කරගනිමින් අනාගතයේදී ඉදිකිරීමට නියමිත ජාතික විද්‍යා මධ්‍යස්ථානයේ ආදර්ශයක් වශයෙන් සංවිධානය කළ මෙම ජාතික විද්‍යා ප්‍රදර්ශනය, රාජ්‍ය හා පෞද්ගලික ආයතන හා විශ්වවිද්‍යාල ආදී විවිධ පාර්ශ්වයන් රැසකගේ සහයෝගයෙන් පවත්වන ලදි.

එසේම විද්‍යාවේ නව ප්‍රවණතාවන් පිළිබඳ මෙන්ම ඒ තුළින් බිහිවන නව රැකියා අවස්ථා ද, එදිනෙදා ජීවිතයේදී විද්‍යාවේ භාවිතාවන් පිළිබඳ ප්‍රවීණයන්ගේ දේශන ද ප්‍රදර්ශනය පැවැත් වූ තෙදින පුරා පවත්වන ලදී. පාසැල් සිසු දරු දැරියන් සහ විශ්වවිද්‍යාල සිසුන්, පර්යේෂකයන්, නව නිපැයුම්කරුවන් මෙන්ම සාමාන්‍ය ජනතාව විශාල පිරිසක් මෙම ප්‍රදර්ශනය නැරඹීමට පැමිණි අතර නොවැම්බර් මස 10 වෙනි දින ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ සහභාගීත්වයෙන් මෙහි සමාප්ති උළෙල පවත්වනු ලැබීය.

- **විද්‍යාව හා තාක්ෂණය ප්‍රචලිත කිරීම සඳහා අවශ්‍ය අධ්‍යාපනික ක්‍රියාකාරකම් සංවිධානය කිරීම**

- ඊ නිවුස් වෙබ් අඩවිය සඳහා ලිපි තරගය සංවිධානය කිරීම සහ ලිපි පළ කිරීම.

මේ ඔස්සේ නවීන විද්‍යා තාක්ෂණ දැනුම සහ ලාංකීය පර්යේෂකයින් මඟින් සිදුකරමින් පවතින, කාලීන පර්යේෂණ හා නවෝත්පාදන සම්බන්ධ තොරතුරු ඇතුළත් පර්යේෂණයන් පිළිබඳ තතු පාසැල් දරුවන් හා මහජනතාව වෙත ලබා දීම මෙහි අපේක්ෂාව වේ.

- විද්‍යා ඊ ත්‍රෛභාෂා මාසික පුවත්පත් සඟරාව පළ කිරීම.

ලේක් හවුස් ආයතනය හා එක්ව තිනකරන්, දිනමිණ, ඩේලි නිවුස් පුවත්පත්වල මාසික අතිරේකයක් වශයෙන් විද්‍යා ඊ ත්‍රෛභාෂා පුවත්පත මෙම වසරේ මුල සිට අඛණ්ඩව පළ කරන ලදී. ඒ සඳහා එක් භාෂාවකින් විද්‍යා ලිපි 53ක් පළ කෙරුණු අතර එහි වාර්ෂික සංවත්සරය හා ජාතික විද්‍යා දින සැමරුම කේන්ද්‍ර කර ගනිමින් නොවැම්බර් කලාපය

විශේෂ මුද්‍රිත සංස්කරණයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමටත්, විද්‍යා පුවත්පත සඳහා අඛණ්ඩව ලිපි රචනා කළ පිරිස් හා පුවත්පතේ නිර්මාණ කටයුතු සඳහා දායක වූ පිරිස් ඇගයීම ද සිදු කරන ලදි .

- විද්‍යා දැනුම හුවමාරු කරගැනීම සඳහා විවිධ ප්‍රදර්ශන හා මාධ්‍ය ආශ්‍රිත වැඩසටහන් සංවිධානය කිරීම.

- විද්‍යා අධ්‍යාපනය වඩාත් ආකර්ශනීය කිරීම සඳහා රූපවාහිනී වැඩසටහන් සංවිධානය කිරීම

නවීන විද්‍යාත්මක සංකල්ප මහජනතාව අතර ප්‍රචලිත කිරීම වෙනුවෙන් ‘‘විද්‍යා’’ නමින් රූපවාහිනී වාර්තාමය වැඩසටහනක් හඳුන්වා දෙන ලදී. මෙම වාර්තා වැඩසටහන විකාශය කිරීම නවීන විද්‍යාත්මක විෂයයන් පිළිබඳ මූලික හැඳින්වීම, තාරකා විද්‍යාව, නැනෝ තාක්ෂණය යන තේමාවන් ඔස්සේ පෙබරවාරි, මාර්තු සහ අප්‍රේල් යන මාසවල අවසන් සතියේ ඉරිදා දිනවල දී ජාතික රූපවාහිනී නාලිකාව ඔස්සේ සිදු කරන ලදි.

➢ ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික සහයෝගීතාවයන් යටතේ ඇති කර ගනු ලැබූ විද්‍යා හා තාක්ෂණ සහයෝගීතාවන්

- **ඉන්දු-ශ්‍රී ලංකා විද්‍යා හා තාක්ෂණ සහයෝගීතාවය**

ඉන්දු-ශ්‍රී ලංකා ඒකාබද්ධ සහයෝගිතා වැඩසටහන යටතේ දෙරට අතර විද්‍යාත්මක දැනුම හුවමාරු කර ගැනීම සඳහා 2019 වසරේ දී අත්සන් කරන ලද සහයෝගීතා වැඩසටහන (Programme of Cooperation) ක්‍රියාත්මක කිරීම අප අමාත්‍යාංශය සතුව ඇති ප්‍රමුඛතම කාර්යයන්ගෙන් එකකි. 2019 ට අදාළව තෝරාගත් පර්යේෂණ ව්‍යාපෘති 08ක් සහ වැඩමුළු 01ක් සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබා දීම සිදුකර ඇති අතර 2023 වර්ෂය තුළ පළමු සහ දෙවන සමාසික ඇගයීම් කටයුතු විද්වත් කමිටුවක් මඟින් සිදුකර එම ව්‍යාපෘති වඩාත් ඵලදායීව ඉදිරියට පවත්වාගෙන යාම සඳහා මාර්ගෝපදේශනය ලබාදීම සිදුකරන ලදී.

ඒ අනුව මෙම ව්‍යාපෘති අතරින් ශ්‍රී ලංකාවේ හා ඉන්දියාවේ වාණිජ උක් වගාකරුවන් මුහුණ දෙන උක් වගාවේ පත්‍ර වල හටගන්නා සුදු පුල්ලි රෝගය පාලනය සඳහා උපාය මාර්ග ක්‍රමවේදයක් සකස් කිරීමේ වැඩමුළුවක් පැල්වත්ත උක් පර්යේෂණ ආයතනයේදී පවත්වන ලදී. මේ සඳහා දෙරටේම පර්යේෂකයින් හා විද්වතුන් සහභාගී වූ අතර සකස් කරන ලද වැඩසටහන කර්මාන්තකරුවන් අතරට ගෙන යාමේ කටයුතු මේ වන විට සිදු කෙරෙමින් පවතී .

- **ශ්‍රී ලංකාව සඳහා වන ඉන්දියානු විද්‍යා සහ පර්යේෂණ අධිශිෂ්‍යත්ව (ISRF)** වැඩසටහන

- මෙම වැඩසටහනේ අරමුණ වන්නේ අසල්වැසි රටවල් වන ඇෆ්ගනිස්ථානය, බංග්ලාදේශය, භූතානය, මාලදිවයින, මියන්මාරය, නේපාලය, ශ්‍රී ලංකාව සහ තායිලන්තය යන රටවල විද්‍යාඥයින්ට සහ පර්යේෂකයන්ට ඉන්දියාවේ ප්‍රමුඛ පර්යේෂණ රසායනාගාර සහ අධ්‍යයන ආයතනවලදී ඉංජිනේරු සහ වෛද්‍ය විද්‍යාව ඇතුළු විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ සියලුම ප්‍රධාන විෂයයන් හරහා නවීන පර්යේෂණ ක්ෂේත්‍රයන්හි පර්යේෂණයන්හි නියැලීමට අවස්ථාව ලබා දීමයි. 2022/2023 දී ISRF වැඩසටහන සඳහා අයදුම්පත් කැඳ වූ අතර අයදුම්කරුවන් 11 දෙනෙකු අතරින් 10 දෙනෙකු සඳහා අධිශිෂ්‍යත්ව ප්‍රදානය කරන ලදී.

- **අත්සන් තබනු ලැබූ සහ ක්‍රියාත්මක කරනු ලැබූ එකඟතාවන් සහ අවබෝධතා ගිවිසුම්**

නේපාලය සහ ශ්‍රී ලංකාව අතර විද්‍යා, තාක්ෂණ සහ නවෝත්පාදන ක්ෂේත්‍රවල සහයෝගීතාව පිළිබඳ අවබෝධතා ගිවිසුමක් (MoU) 2023.12.21 දින අත්සන් කරන ලදී.
ඒ අනුව රටවල් 11ක් සමඟ අවබෝධතා ගිවිසුම් 13ක් සඳහා එළඹ ඇත.

➢ පර්යේෂණ සහ නව නිපැයුම් සඳහා පහසුකම් සැපයීම

රට තුළ සිදු කෙරෙන සියලුම පර්යේෂණවල දත්ත විධිමත් ලෙස ලබා ගැනීම, එම දත්ත වල සුරක්ෂිතතාවය තහවුරු කිරීම, එවැනි පර්යේෂණ සඳහා පහසුකම් සැලසීම මෙන්ම වෙළඳපොලක් නිර්මාණය කිරීම අරමුණු කරමින් රජයේ ප්‍රතිපාදන මත සිදු කරන පර්යේෂණ පිළිබඳ තොරතුරු රැස් කරමින් එම පර්යේෂණ කළමනාකරණය සහ අධීක්ෂණය සඳහා ජාතික පර්යේෂණ කළමනාකරණ තොරතුරු පද්ධතිය ස්ථාපිත කිරීමේ ජාතික අවශ්‍යතාව සපුරාලීම සඳහා එම ව්‍යාපෘතිය ජාතික පර්යේෂණ සභාව හරහා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවට යොමුකරන ලදී. මේ මඟින් සියලුම රාජ්‍ය පර්යේෂණ ආයතන සහ පර්යේෂකයන් ලියාපදිංචි කර ගැනීමට අපේක්ෂිත අතර පර්යේෂණ ප්‍රදානයන් ලබා ගැනීම සඳහා අයදුම් කිරීමේදී මෙම තොරතුරු පද්ධතිය හරහා එම කටයුතු සිදු කිරීමට යෝජනා කර ඇත. මෙමගින් පර්යේෂණ ප්‍රදාන ලබා දීමට සුදුසු පර්යේෂණ තෝරා ගැනීම සහ ඇගයීම් කටයුතු සිදු කිරීම වඩාත් විධිමත්ව හා විනිවිදභාවයෙන් සිදු කිරීමටත් පර්යේෂණ ද්විිකරණය වීම වලක්වා ගැනීමටත් අමාත්‍යාංශය බලාපොරොත්තු වේ. මෙම තොරතුරු පද්ධතියේ මූලාකෘතිය සකස් කිරීම මේ වනවිට අවසන් කර ඇත.

- **කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2014 ට අනුව පර්යේෂණ දීමනා ගෙවීම සඳහා වූ පර්යේෂණ සමාලෝචනය කිරීම**

කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2014 ට අනුව රාජ්‍ය නිලධාරීන්ට පර්යේෂණ දීමනා ගෙවීමට අදාළව පර්යේෂණ කළමනාකරණ කමිටුව සහ පර්යේෂණ අධීක්ෂණ කමිටු රැස්කරමින් පර්යේෂණ යෝජනා ඇගයීම, නිර්දේශ ලබා දීම පර්යේෂණ විෂය භාර අමාත්‍යාංශයේ මූලිකත්වයෙන් සිදු කෙරේ. ඒ අනුව 2014 වර්ෂයේ නිකුත් කරන ලද චක්‍රලේඛය සංශෝධනය කිරීමේ අවශ්‍යතාව පිළිබඳ සාකච්ඡාවක් අදාළ පාර්ශ්වකරුවන් සම්බන්ධ කරගනිමින් සිදු කරන ලදී. මීට අමතරව මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක පර්යේෂණ කළමනාකරණ කමිටුව මඟින් 2023 වර්ෂයේ පර්යේෂණ ව්‍යාපෘති 24ක් ඇගයීම සිදුකළ අතර ඒ සඳහා පර්යේෂණ කමිටු රැස්වීම් 03ක් මෙම වසරේ දී පවත්වන ලදී.

- **අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ඇති පර්යේෂණ ආයතන මඟින් සිදු කරනු ලබන පර්යේෂණ අධීක්ෂණය සහ ඇගයීම.**

මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක SLINTEC ආයතනයේ පර්යේෂණ සඳහා වෙන් කරන ලද රු.මිලියන 90ක් වූ අමාත්‍යාංශ ප්‍රතිපාදනවලට අදාළව එම ආයතනයෙන් පුනර්ජනනීය බලශක්තිය, කෘෂිකර්මය, ආහාර විද්‍යාව, ඖෂධ වර්ග යන ක්ෂේත්‍ර යටතේ ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා ඇගයීම සඳහා විධිමත් ක්‍රමවේදයක් හඳුන්වා දෙන ලදී. එම ව්‍යාපෘති ඇගයීම සඳහා විශ්වවිද්‍යාලවලින් විශේෂඥ මණ්ඩලයක් තෝරා පත් කෙරුණු අතර එම විශේෂඥ මණ්ඩලය විසින් ඇගයීමට ලක් කරන ලද පර්යේෂණ සඳහා අනුමැතිය ලබා දෙන ලදී .

➢ පොහොර වර්ග වැඩිදියුණු කිරීම සහ පාංශු කළමනාකරණය හරහා නිසරු වූ බිම් සාරවත් භාවයට පත්කිරීම

"පොහොර වර්ග වැඩිදියුණු කිරීම සහ පාංශු කළමනාකරණය හරහා නිසරු වූ බිම් සාරවත් භාවයට පත් කිරීම" පිළිබඳ ව්‍යාපෘතිය අවසන් කිරීමෙන් පසු, වී සහ අනෙකුත් බෝග වගාවන්, බෝග අස්වැන්නට බාධාවක් නොවන පරිදි දේශීයව ලබා ගන්නා ද්‍රව්‍යවලින් පරිසර හිතකාමී බවට පත් කිරීමේ නව ව්‍යාපෘතියක් ආරම්භ කරනු ලැබිණි. නව ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර, ජෛව පටල මත පදනම් වූ 100% ජෛව කාබනික ඛනිජ (BOM) පොහොර භාවිතයේ ශක්‍යතාවය විමර්ශනය කිරීම සඳහා 2023 යාල ප්‍රදේශයේ වැලිකන්ද සහ දෙහිඅත්තකණ්ඩිය ප්‍රදේශයේ කුඩා බිම් කැබලි (20 m^2) භාවිතයෙන් ක්ෂේත්‍ර පරීක්ෂාවන් දෙකක් ආරම්භ කරන ලදී. ක්ෂේත්‍ර බිම් සකස් කරන ලද අතර බිම් කොටස් සඳහා BOM ප්‍රතිකාර තුනක් යොදන ලදී. 2023 වර්ෂය තුළ වාණිජ වැඩසටහන යටතේ කුරුණෑගල, කිලිනොච්චිය, වවුනියාව, මුලතිව්, මඩකලපුව සහ කොළඹ යන ප්‍රදේශවල ධාන්‍ය අස්වැන්න 20%කින් පමණ ඉහළ යාමත් සමඟ BFBF සහ NPK අඩු මාත්‍රාවලින් (50% දක්වා) වී අක්කර 25,000ක් පමණ සාර්ථකව වගා කරන ලදී. BFBF යෙදීමත් සමඟ පසෙහි කාබන් තිර කිරීම සැලකිය යුතු ලෙස වැඩි වන බව ද නිරීක්ෂණය විය.

රසායනික පොහොර සඳහා පමණක් පොහොර සහනාධාරය ලබාදීමට රජය ගත් ප්‍රතිපත්තිමය වෙනස හේතුවෙන් 2023 වසරේ වී වගාවට BFBF බෙදා හැරීම අඩු විය. 2023 වසරේදී සෝයා බෝංචි, මුං ඇට, එළවළු බෝංචි සහ රටකජු වගාවන් අක්කර 6,070ක් සඳහා රයිසෝබියම් ජෛව පොහොර බෙදා දෙන ලදී.

➢ සූර්ය පැනල මූලාකෘති නිෂ්පාදන ව්‍යාපෘතිය

2017 දී අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඇතිව "සූර්ය පැනල මූලාකෘති නිෂ්පාදනය පිළිබඳ අධ්‍යාපනික පුහුණු ව්‍යාපෘතිය" ක්‍රියාත්මක කරන ලදී. අමාත්‍යාංශය විසින් කැලණිය විශ්වවිද්‍යාලයේ ව්‍යාපෘති කාර්යාලය හරහා ව්‍යාපෘතිය පරිපාලනය කරනු ලබන අතර යාපනය, කැලණිය සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලවල ක්‍රියාත්මක කෙරේ. මූලික ව්‍යාපෘති කාලය 2017-2021 දක්වා වූ අතර පසුව ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ (NPD) සහ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ඇතිව 2023 දක්වා දීර්ඝ කරන ලදී.

විකල්ප පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයක් ලෙස සූර්ය බලශක්තිය භාවිතා කිරීම සම්බන්ධයෙන් උතුරු හා නැගෙනහිර ඇතුළුව රටෙහි විවිධ දිස්ත්‍රික්කවල පාසැල් 48ක් සඳහා සිසුන් 3277ක් ආවරණය වන පරිදි පාසැල් දැනුවත් කිරීමේ වැඩසටහන් 36ක් සම්පූර්ණ කරන ලදී. 2019/2020 වර්ෂයේදී අමාත්‍යාංශය සහ විශ්වවිද්‍යාල විසින් සංවිධානය කරන ලද ජාතික ප්‍රදර්ශන තුනකදී මෙම දැනුවත් කිරීමේ වැඩසටහන පවත්වන ලද අතර පාසැල් සිසුන් විශාල සංඛ්‍යාවක් සඳහා මේ හරහා ප්‍රතිලාභ අත්විය. සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ පාසැල් ගුරුවරුන් 38 දෙනෙකු සඳහා එක් ගුරු දැනුවත් කිරීමේ වැඩසටහනක් ද පවත්වන ලදී.

අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි වූ යෝජනාවේ දක්වා ඇති පරිදි, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (NAITA) සහ ශ්‍රී ලංකා සුනිත්‍ය බල ශක්ති අධිකාරිය (SLSEA) සමඟ එක්ව, රට තුළ ප්‍රථම වරට NVQ 3 සහ 4 මට්ටමේ සූර්ය බලශක්ති කාර්මික ශිල්පීන් පුහුණු කිරීමේ වැඩසටහන සකස් කර ක්‍රියාත්මක කිරීමට ව්‍යාපෘති කණ්ඩායම මූලික විය. NAITA ආයතනය සතුව මෙම වැඩසටහන සඳහා විෂය මාලාවක් සහ පුහුණු වැඩසටහනක් නොතිබූ බැවින් ව්‍යාපෘති කණ්ඩායම විසින් මෙම පාඨමාලාව සඳහා සම්පූර්ණ විෂය මාලාවම සකස් කරන ලදී. මෙම වැඩසටහන මාස 5ක සිද්ධාන්ත ඉගෙනුම, මාස 12ක රැකියා පුහුණුව (OJT) සහ හම්බන්තොට සූර්ය බලශක්ති උද්‍යානයෙහිදී මාසයක උසස් පුහුණුවකින් සමන්විත වේ. තවද, තෝරාගත් NAITA කාර්යය මණ්ඩලය සඳහා NVQ 4 මට්ටමේ සූර්ය බලශක්ති කාර්මික ශිල්පී පුහුණු වැඩසටහන පැවැත්වීම සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීමේ (ToT) වැඩසටහනක් පවත්වන ලදී. සිසුන් 107 (මුලින් ලියාපදිංචි වී ඇති 158) දෙනෙකුගෙන් යුත් පළමු කණ්ඩායම 2021 මැයි මාසයේදී ඔවුන්ගේ NVQ 4 මට්ටමේ සූර්ය බලශක්ති කාර්මික ශිල්පී පාඨමාලාවේ පුහුණු කොටස සම්පූර්ණ කරන ලදී. NAITA සහ SLSEA සමඟ එක්ව මෙම පුහුණු වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. NVQ අභ්‍යාසලාභීන් 84 දෙනෙකු SLSEA සමඟ සහයෝගීත්වයෙන් හම්බන්තොට සූර්ය උද්‍යානයේ උසස් පුහුණු වැඩසටහනක් (ප්‍රායෝගික සැසියක්) සම්පූර්ණ කරන ලදී.

මෙය නව වැඩසටහනක් වූ බැවින් අපේක්ෂකයින්ගේ නිපුණතාවය තක්සේරු කිරීමට අවශ්‍ය තක්සේරුකරුවන් රට තුළ නොසිටි බැවින්, තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) සමඟ සහයෝගයෙන් ක්‍රියා කරමින් NVQ 3 සහ 4 මට්ටමේ සූර්ය බල ශක්ති කාර්මික ශිල්පීන් පුහුණු කිරීමේ වැඩසටහනේ ඇගයීම් තක්සේරු කිරීම සඳහා තක්සේරුකරුවන් 4 දෙනෙකු පුහුණු කිරීමට ව්‍යාපෘතිය විසින් පියවර ගනු ලැබිණි. මීළඟ පුහුණුව සඳහා තවත් අයදුම්පත් 8ක් පමණ ලැබී ඇති අතර, ඒවා TVEC වෙත යොමු කරන ලදී. හම්බන්තොට සූර්ය බලශක්ති උද්‍යානයෙහි දී පැවති අවසන් ඇගැයීම්වලින් පසු අයදුම්කරුවන් 35 දෙනෙකු NVQ 4 මට්ටමේ සුදුසුකම් සහිතව සහතිකපත් ලබා ඇති අතර ඉන් 30 දෙනෙකු NVQ 3 මට්ටමේ සුදුසුකම් සහිතව සහතිකපත් ලබා ඇත. මෙම සහතිකපත්ලාභීන් සඳහා නිල සහතිකපත් ප්‍රදානෝත්සවය 2022 අගෝස්තු 22 වන දින ගරු අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. NVQ 4 මට්ටමේ සූර්ය බල ශක්ති කාර්මික ශිල්පී පුහුණු වැඩසටහන සඳහා 2 වන කණ්ඩායම NAITA මධ්‍යස්ථාන 9 කදී අපේක්ෂකයින් 136 දෙනෙකු සඳහා ආරම්භ කරන ලදී.

- **පර්යේෂණ සහායක (සහභාගීවන විශ්වවිද්‍යාලයන්හි පූර්ණ කාලීන පර්යේෂණ පුහුණුව)**
  - යාපනය - 1 (MPhil - සම්පූර්ණ කළ යුතුව ඇත.)
  - කැලණිය - 2 (1 PhD - සම්පූර්ණ කළ යුතුව ඇත. 1 MPhil - සම්පූර්ණ කර ඇත)
  - පේරාදෙණිය - 2 (1 PhD සහ 1 MPhil - සම්පූර්ණ කළ යුතුව ඇත)

මෙම MPhil/PhD සිසුන් පස්දෙනා තුනී පටල සූර්ය කෝෂ පිළිබඳ නව පර්යේෂණ සොයාගැනීම් පිළිබඳ සුවිගත සඟරා පත්‍රිකා 15ක් සහ සම-සමාලෝචනය කළ සම්මන්ත්‍රණ පත්‍රිකා 17ක් ප්‍රකාශයට පත් කර ඇත. එක් සිසුවෙකු MPhil උපාධිය සඳහා පුහුණුව අවසන් කර ඇත. තුනී පටල සහිත මූලාකෘති සූර්ය පැනල 12ක් නිපදවා කැලණිය විශ්වවිද්‍යාලයේ දී ප්‍රදර්ශනය කිරීමට ව්‍යාපෘතියට හැකි විය.

➢ ශ්‍රී ලංකා නිනිති තාක්ෂණ ආයතනය (පෞද්.) සමාගම (SLINTEC)

ශ්‍රී ලංකා නිනිති තාක්ෂණ ආයතනය කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා ප්‍රධාන වශයෙන් නව නිෂ්පාදනයන් සිදු කිරීම සහ පවත්නා ගැටළු සඳහා විසඳුම් ලබා දීම අරමුණු කර ගනිමින් නිනිති සහ උසස් තාක්ෂණ ක්ෂේත්‍රයන්හි විද්‍යාත්මක පර්යේෂණ සහ සංවර්ධන කාර්යයන්හි නිරතව සිටී. වර්තමානයේදී අවධානය යොමු වී ඇති ක්‍රියාකාරී ක්ෂේත්‍ර වනුයේ තිරසාර සහ ක්‍රියාකාරී රෙදිපිළි වර්ග, ස්වාභාවික නිෂ්පාදන සහ පෝෂණීය ආහාර අතිරේක, බලශක්ති ගබඩා කිරීම්, උසස් කෘෂි තාක්ෂණයන්, මුද්‍රණය කළ හැකි ඉලෙක්ට්‍රොනික් සහ සංවේදක, උසස් ද්‍රව්‍ය සහ ඛනිජ වේ.

- **පර්යේෂණ ව්‍යාපෘති**

2023 වර්ෂය තුළදී SLINTEC ආයතනය විසින්, කර්මාන්ත අවශ්‍යතා හඳුනාගැනීමත් SLINTEC හි පර්යේෂණ සහ විශ්ලේෂණ ශක්‍යතාවන් පිළිබඳ දැනුම්වත් කිරීමත් අරමුණු කරගනිමින් රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශයම නියෝජනය කෙරෙන සමාගම් 100කට අධික සංඛ්‍යාවක් සමඟ සාකච්ඡාවන් පවත්වනු ලැබිණි. කර්මාන්ත 15කට ආසන්න සංඛ්‍යාවක් සඳහා ශක්‍යතා අධ්‍යයනයන් සිදු කර ආදායම් උපයා ගැනීමට SLINTEC ආයතනය සමත්ව ඇත.

2022 වසරේදී ආරම්භ කරනු ලැබූ ව්‍යාපෘති කිහිපයක් 2023 දක්වා අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලැබූ අතර පෞද්ගලික අංශයේ සමාගම් සමඟ ගිවිසුම්ගත පර්යේෂණයන්ට එළැඹීම සඳහා තවත් පර්යේෂණ ගිවිසුම් 5ක් SLINTEC ආයතනය විසින් අත්සන් තබනු ලැබ ආදායම් උපයා ගන්නා ලදී. අධ්‍යාපන අමාත්‍යාංශය විසින් දීර්ඝ කාලීන පර්යේෂණ ලෙස ව්‍යාපෘති 2ක් සඳහා අරමුදල් සපයා දෙනු පිණිස අනුමැතිය ලබා දෙන ලදී .

අංශය	ක්‍රියාත්මක කරනු ලැබූ ව්‍යාපෘති සංඛ්‍යාව	අරමුදල් සැපයීම
තිරසාර සහ ක්‍රියාකාරී රෙදිපිළි වර්ග	2	පෞද්ගලික අංශය
ස්වාභාවික නිෂ්පාදන සහ පෝෂණීය ආහාර අතිරේක	1	පෞද්ගලික අංශය
උසස් කෘෂි තාක්ෂණයන්	3	පෞද්ගලික අංශය සහ රාජ්‍ය අංශය
ස්වාභාවික නිෂ්පාදන සහ පෝෂණීය ආහාර අතිරේක	1	රාජ්‍ය අංශය

- **තාක්ෂණ පැවරුම් / වාණිජකරණය**

2023 වසරේදී සී/ස නැවුරල් වොයිස් (පෞද්.) සමාගම වෙත ප්‍රති ක්ෂුද්‍රජීවී ආලේප තාක්ෂණය පවරා දෙන ලදී.

- **උපදේශන සහ විශ්ලේෂණ සේවා**

SLINTEC උසස් විශ්ලේෂණ සේවා විද්‍යාගාරය, UNIDO මගින් එහි BESPA-FOOD PROJECT Accreditation Readiness Program යටතේ ISO 17025 විද්‍යාගාර තත්ත්ව කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම සහ විශාල ඉල්ලුමක් සහිත තෝරාගත් ආහාර පරීක්ෂා සඳහා ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ ප්‍රතීතනය ලබාගැනීම උදෙසා තෝරා ගනු ලැබ ඇත.

ලියාපදිංචි වී ඇති සාමාජිකයින් හට දවසේ ඕනෑම වේලාවක දී පූර්ණ සේවාව සපයාදෙනු ලබන විශ්ලේෂණ මධ්‍යස්ථානයක් SLINTEC විසින් ස්ථාපනය කරනු ලැබ ඇත. SLINTEC විශ්ලේෂණ මධ්‍යස්ථානය, 2023 මැයි 31 දින ජාතික විද්‍යා පදනම් ශ්‍රවණාගාරයේ දී කර්මාන්ත අංශයේ නියෝජිතයන් 50කට ආසන්න පිරිසකගේ සහභාගීත්වයෙන් දියත් කරනු ලැබිණි.

SLINTEC විසින් කර්මාන්ත අංශයේ 250කට ආසන්න සංඛ්‍යාවක් සහ විශ්වවිද්‍යාල සහ පර්යේෂණ ආයතනයන්හි 100කට අධික පිරිසක් සඳහා විශ්ලේෂණ සේවාවන් සපයා දී ඇත.

- **විද්‍යාව ප්‍රචලිත කිරීම**

විද්‍යාව ප්‍රචලිත කිරීම අරමුණු කර ගනිමින් SLINTEC ආයතනය විසින් වැඩසටහන් 15කට අධික සංඛ්‍යාවක් පවත්වනු ලැබූ අතර ඒ හරහා 7000 කට අධික පිරිසකට ප්‍රතිලාභ හිමිවිණි. නොවැම්බර් 8 සිට 10 දක්වා කොළඹ ජාතික කෞතුකාගාර පරිශ්‍රයේ දී පැවති ජාතික විද්‍යා ප්‍රදර්ශනයේ දී, SLINTEC ආයතන කණ්ඩායම විසින් නිනිති තාක්ෂණය සහ එහි යෙදවුම් පිළිබඳ මහජනතාව දැනුම්වත් කරමින් සිය ශක්‍යතාවන් ප්‍රදර්ශනය කරන ලදි.

➢ **ශ්‍රී ලංකා ඉන්ස්ටිට්යුට් ඔෆ් බයෝටෙක්නොලොජී (**SLIBTEC**)**

- **පර්යේෂණ ව්‍යාපෘති**

- ජෛව තොරතුරු තාක්ෂණය (2), වෛරස විද්‍යා (1), එන්සයිම විද්‍යා (1) ක්ෂේත්‍රයන්හි පර්යේෂණ ව්‍යාපෘති 4ක් සිදු කර ඇත.
- ගිවිසුම්ගත පර්යේෂණ (1) - ශ්‍රී .ලං.රු. මිලියන 2.4

- **විද්‍යාත්මක ක්ෂේත්‍රයේ ජයග්‍රහණ**

පේටන්ට්	ප්‍රකාශන	ජාත්‍යන්තර පුහුණු	ජාත්‍යන්තර සම්මන්ත්‍රණ
01 (අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.)	08	05	01

- **ප්‍රදාන**

SLIBTEC විසින් ප්‍රදාන 13ක් සඳහා ඉල්ලුම් කරනු ලැබ, 2024 මැයි මසදී next generation sequencing පිළිබඳ නේවාසික වැඩමුළුවක් පැවැත්වීම සඳහා ICGEB වෙතින් එක් ප්‍රදානයක් ලැබී ඇත.

- **විද්‍යාගාර උපකරණ**

ආසියානු සංවර්ධන බැංකු උපකරණ ප්‍රදාන හරහා, අනුක්‍රම නිර්ණ පහසුකම සංවර්ධනය සඳහා අනුක්‍රම නිර්ණ යන්ත්‍රයක් (NextSeq 550 and MiSeq) සහ Flowcytometer උපකරණය SLIBTEC වෙත ලැබිණි

- **අවබෝධතා ගිවිසුම් සඳහා අත්සන් තැබීම**

SLIBTEC ආයතනය විසින් 2023 අගෝස්තු 10 දින ජාන ඉංජිනේරු විද්‍යා සහ ජෛවතාක්ෂණ ජාත්‍යන්තර මධ්‍යස්ථානය (ICGEB) සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් තබනු ලැබූ අතර ඒ යටතේ ICGEB හි දකුණු ආසියානු කලාපීය මධ්‍යස්ථානය ලෙස SLIBTEC ක්‍රියා කරනු ඇත. කලාපීය පර්යේෂණ මධ්‍යස්ථානය ස්ථාපනය කිරීමෙන් පසු ජෛව තාක්ෂණ සහ ඒ හා සම්බන්ධිත ක්ෂේත්‍රයන්හි වෘත්තිකයින්ගේ විශේෂඥ දැනුම ලබා ගැනීමට අපේක්ෂිතය.

- **SLIBTEC** ව්‍යාපාර සංවර්ධනය

SLIBTEC විසින් ගිවිසුම්ගත පර්යේෂණ සඳහා පෞද්ගලික පාර්ශ්වයන් 2ක් සමඟ හෙළිදරව් නොකිරීමේ ගිවිසුම් අත්සන් තබන ලදී.
ලයන් බරුවරි (Lion Brewery PLC) – ශ්‍රී ලංකා රු.මිලියන 2.4 (2023 දෙසැම්බර් මසදී මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී.)
සිසිලි ප්‍රොජෙක්ට්ස් කොන්සෝටියම් (Sisili Projects Consortium) - ශ්‍රී ලංකා රු.මිලියන 18

- **රසායනාගාර සේවාවන්**

- රසායනාගාර සේවාවන් 5ක් සම්පූර්ණ කරන ලදී ;
  ලෝක සෞඛ්‍ය සංවිධානය සඳහා HPV වෛරසය හි PCR අනාවරණය (WHO) - ශ්‍රී ලංකා රු.මිලියන 5.7
  අනුක්‍රම නිර්ණ සේවාවන් (Sequencing services) – ශ්‍රී ලංකා රු.මිලියන 0.5

- **ව්‍යාපාර ආරම්භක බීජෞෂණ සේවා**

- බිම් කොටස් 5කින් බිම් කොටස් 2ක් සී/ස UKCAS (පෞද්.) සමාගම සහ සී/ස නියුටිඔයිල්ස් (Nutioils) (පෞද්.) සමාගම වෙත කුලී පදනම මත ලබා දී ඇත.

- **SLIBTEC** උද්‍යානය

- මූලික පාරිසරික පරීක්ෂා වාර්තාව (IEE) සම්පූර්ණ කරනු ලැබ ඇත.
- ආයෝජකයින්ගේ අභිමත ප්‍රකාශනයන් (EoI) සම්පූර්ණ කරනු ලැබ ඇත.
- මූලික යටිතල කාර්යයන් දැනට සිදු කෙරේ.
- USAID PARTNER ප්‍රදාන හරහා සංකල්පික උද්‍යාන සැලසුම් නිර්මාණය සම්පූර්ණ කර ඇත.
- සමීක්ෂණ සැලසුම සකස් කර ඇත.
- ඉඩම් තක්සේරු කිරීමේ කාර්යයන් සිදු කර ඇත.

➢ **ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරය**

ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරය විසින් ශ්‍රී ලාංකික පාසැල් සිසුන් මෙන්ම සාමාන්‍ය ජනතාව දැනුම සඳහා ඇති කුතුහලය සංසිදුවීම උදෙසා ග්‍රහලෝකාගාර දර්ශන, එළිමහන් වැඩසටහන් සහ තාරකා විද්‍යා පාඨමාලා පැවැත්වීම හරහා සිය අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කරන ලදී. මෑතකදී එක් කරනු ලැබූ තාක්ෂණ උද්‍යානය නරඹන්නන් සඳහා භෞතික සංසිද්ධීන් පිළිබඳ තත්‍ය අත්දැකීම් ලබා දීමට සමත් වේ. රාත්‍රී අහස නිරීක්ෂණ කඳවුරු, විශේෂ ස්වාභාවික සංසිද්ධි නිරීක්ෂණ කඳවුරු, තාරකා විද්‍යා වැඩමුළු, විද්‍යා ප්‍රදර්ශන සහ සම්මන්ත්‍රණ දීපව්‍යාප්ත මට්ටමින් පැවැත්වේ. තවද, තාරකා විද්‍යා පාඨමාලා සහ එළිමහන් වැඩසටහන් සම්පූර්ණයෙන් නොමිලේ පවත්වනු ලැබේ. සවිඥානික අත්දැකීම් හරහා තාරකා විද්‍යාව පිළිබඳ ජනතාවගේ උද්යෝගය වර්ධනය කරවීම අරමුණු කර ගනිමින් මෙම සියලු ක්‍රියාකාරකම් සිදු කෙරේ.

- **විද්‍යාව ප්‍රචලිත කිරීමේ වැඩසටහන**

පාසැල් සිසුන් සහ සාමාන්‍ය ජනතාව අතර විද්‍යාව ප්‍රචලිත කිරීම අරමුණු කර ගනිමින් පහත ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

වැඩසටහන	2023 වර්ෂය සඳහා ඉලක්ක		ජයග්‍රහණ 2023	
	වැඩසටහන	ප්‍රතිලාභීන්	වැඩසටහන	ප්‍රතිලාභීන්
1. ග්‍රහලෝකාගාර දර්ශන	400	200,000	478	271,235
2. එළිමහන් වැඩසටහන්	30	7,000	20	10,925
3. තාරකා විද්‍යා පාඨමාලා	4	150	2	115

2023 වසරේදී උපයා ගත් ආදායම – රු.මිලියන 22.79

2.2. 2024 වර්ෂය සඳහා ඉලක්කයන්


- විදේශ රැකියා ක්ෂේත්‍රයේ ඉහළ ඉල්ලුමක් පවතින රැකියා අවස්ථා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හරහා හඳුනාගැනීමට හා ඒ සඳහා සුදුසු නිපුණ ශ්‍රමිකයන් බිහි කිරීම සඳහා පුහුණු ආයතනවල වැඩසටහන් සැලසුම් කිරීමට මඟ පෙන්වීම
- උසස් පෙළ තාක්ෂණ විෂය ධාරාව යටතේ විශ්වවිද්‍යාල වරම් අහිමි සිසුන් සඳහා වෘත්තීය පුහුණු අවස්ථා පුළුල් කිරීම මඟින් සිසුන් 2,000ක් සඳහා වෘත්තීය පුහුණුව ලබා දීම
- KOICA ආධාර යටතේ ක්‍රියාත්මක වන තාක්ෂණ හා කාර්මික විද්‍යාලවල ඉදිකිරීම් ක්ෂේත්‍රයේ වැඩහල්වල නවීකරණ ව්‍යාපෘතියේ අවසන් අදියරේ කටයුතු නිම කිරීම
- GIZ Vocational Training in Sri Lanka ව්‍යාපෘතියේ දෙවන අදියර (VTSL-Phase II) යටතේ යූරෝ මිලියන 7ක් සඳහා යෝජිත ගිවිසුම දෙපාර්ශවය අතර අත්සන් කිරීමට නියමිතය. එමෙන්ම, යෝජිත නව GIZ – VTSL- Phase II ව්‍යාපෘතිය මඟින් ජර්මානු සහයෝගිතාව යටතේ ස්ථාපිත කරන ලද වෘත්තීය පුහුණු ආයතන (CGTTI, SLGTI) සහ වෙනත් රාජ්‍ය ආයතනවල වෘත්තීය පුහුණු ක්ෂේත්‍රය සඳහා තාක්ෂණික සහය මෙන්ම විධායක නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. තවද, විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සහ සමාජීය ආන්තික තත්වයට පත් පුද්ගලයින් සඳහා රැකියා මූලික වෘත්තීය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. එසේම, පරිසර හිතකාමී වෘත්තීය අධ්‍යාපනික පුහුණු වැඩසටහන් (TVET Programs) ලෙස ආහාර පෝෂණය, පුනර්ජනනීය බලශක්ති, අපද්‍රව්‍ය කළමනාකරණ යනාදී අංශ යටතේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ වෘත්තීය පුහුණු පාඨමාලා සඳහා විෂයමාලා සකස් කිරීමට අවශ්‍ය තාක්ෂණික සහය ලබා දීම
- S4IG ව්‍යාපෘතිය යටතේ මුළු දිවයින පුරා සංචාරක ක්ෂේත්‍රයේ අගයදාමයන් ප්‍රවර්ධනය කිරීම හා විශේෂ අවශ්‍යතා සහිත ආන්තික ප්‍රජාව ප්‍රමුඛ කර ගනිමින් වෘත්තීය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- වෘත්තීය පුහුණු ආයතනවල සිසුන් සඳහා ආරක්ෂිත ඇඳුම් කට්ටල 15,000ක් ලබා දීම
- නිපුණතා සිසු සවිය ශිෂ්‍යාධාර ක්‍රමය යටතේ NVQ 7 මට්ටම දක්වා වෘත්තීය පුහුණු ආයතනවල පුහුණුව ලබන සිසුන් 17,500කට ආසන්න පිරිසකට මාසිකව රු.4,000/-ක ශිෂ්‍යාධාරයක් ගෙවීම සඳහා රුපියල් මිලියන 700ක ප්‍රතිපාදන වෘත්තීය පුහුණු ආයතන වෙත ලබා දීම

- ස්වයං රැකියා උත්පාදන උපණය යෝජනා ක්‍රමය (SEPI) යටතේ රුපියල් මිලියන 70ක ණය නිකුත් කිරීම
- ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 5,6 සහ 7 හදාරණු ලබන වෘත්තීය පුහුණුලාභීන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශනය අරමුණු කරගත් TVET Career Platform Project in Sri Lanka ව්‍යාපෘතියේ (ඇමරිකානු ඩොලර් මිලියන 6ක) ඉදිරි කටයුතු කිරීම
- ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයට අනුබද්ධිතව පිහිටුවීමට යෝජිත ජාතික ධීවර හා සමුද්‍රීය පුහුණු ආයතනය (NIFMAT) පිහිටුවීමට අදාළ කටයුතු ඉටු කිරීම
- ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය සඳහා යෝජිත කොරියානු ණය ආධාර යටතේ පහසුකම් සහිත විශ්වවිද්‍යාල පරිශ්‍රයක් ඉදිකිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී මේ වන විට ඉදිරි කටයුතු සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර, ඒ අනුව, ණය ලබා ගැනීමේ කටයුතු සිදු කිරීමෙන් පසු ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කිරීම
- 2024 ජූලි 15 දිනට යෙදී ඇති ලෝක තරුණ නිපුණතා දිනයට සමගාමීව නිපුණතා තරඟාවලියක් පැවැත්වීම.
- පර්යේෂණ ව්‍යාපෘති සඳහා පෞද්ගලික අංශය සමඟ සම්බන්ධ වීම සහ සම්පූර්ණ කරනු ලැබූ පර්යේෂණ ව්‍යාපෘති වාණිජකරණය සඳහා සහාය දැක්වීම
- SLIBTEC උද්‍යානය වැඩිදියුණු කිරීම සහ ජෛව තාක්ෂණ වාණිජ නිෂ්පාදන සංවර්ධනය අරමුණු කරගත් ගිවිසුම්ගත පර්යේෂණ ප්‍රවර්ධනය
- ICGEB හි කලාපීය පර්යේෂණ මධ්‍යස්ථානය ක්‍රියාත්මක කිරීම
- නවෝත්පාදන සඳහා ඇති ජාතික අවශ්‍යතාව හඳුනාගැනීමේ යාන්ත්‍රණයක් ස්ථාපනය කිරීම
- ජාතික පර්යේෂණ සහ සංවර්ධන රාමුවෙහි අන්තර්ගතය ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ පාර්ශ්වයන් අතර දැනුම්වත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම සහ ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිසම හා එක්ව එය යාවත්කාලීන කිරීම් කටයුතු සම්පූර්ණ කිරීම
- පර්යේෂණ ප්‍රතිඵල වාණිජකරණය සඳහා පහසුකම් සලසා දීම
- ඉන්දු-ශ්‍රී ලංකා විද්‍යා සහ තාක්ෂණ සහයෝගිතාවය යටතේ දැනට ක්‍රියාත්මක පර්යේෂණ ව්‍යාපෘතීන්හි ප්‍රගතිය සමාලෝචනය කිරීම සහ 2023 වසරේදී අවසන් වීමට නියමිත ව්‍යාපෘතීන් සඳහා ප්‍රතිපාදන ලබාදීම සහ ඉදිරි සැලසුම් සකස් කිරීම
- 2025 වසරේදී CERN ක්‍රියාකාරී කමිටුවෙහි මාර්ගෝපදේශකත්වය යටතේ CERN ව්‍යාපෘතියෙහි දෙවන චක්‍රය ආරම්භ කිරීම
- රාජ්‍ය ප්‍රතිපාදන යටතේ සහ ද්විපාර්ශ්වික හා බහුපාර්ශ්වික සහයෝගිතා පර්යේෂණ හරහා සිදුකෙරෙන පර්යේෂණ අධීක්ෂණය සහ ඇගයීම සඳහා ක්‍රමවේදයක් (ජාතික පර්යේෂණ කළමනාකරණ තොරතුරු පද්ධතිය) ස්ථාපනය සහ පවත්වාගෙන යාම
- ග්‍රහලෝකාගාර දර්ශනයන්හි භාවිතය සඳහා පූර්ණ අර්ධගෝල සිනමාපට දත්ත ගබඩාව වැඩිදියුණු කිරීම

2.3. අභියෝගයන්

- වෘත්තීය පුහුණු ආයතනවල පහසුකම් පුළුල් කිරීම සඳහා කෙරෙන ආයෝජන ප්‍රමාණවත් නොවීම හා මූල්‍ය අර්බුදය හේතුවෙන් මෙතෙක් සිදුකරගෙන ආ ව්‍යාපෘති ඉලක්ක අනුව ක්‍රියාත්මක නොවීම
- අඩු පාරිතෝෂිකයන් නිසා පුහුණු කාර්යමණ්ඩලය ආකර්ශනය නොවීම හා ඔවුන් විදේශ රැකියා සඳහා යොමු වීම නිසා ඇති වන පුහුණු උපදේශකවරු හිඟය

- ජීවන වියදම ඉහළ යෑම හේතුවෙන් ළමුන් විධිමත් පුහුණු පාඨමාලා සඳහා යොමුවීම වෙනුවට ප්‍රාථමික ආදායම් මාර්ග වෙත යොමු වීම
- සිසුන් පාඨමාලා අතරමඟ නවත්වා හැරයෑම
- රැකියා වෙළඳපලතුළ ඇති වී ඇති වෙනස්කම් නිසා ඉදිකිරීම් ක්ෂේත්‍රයෙන් පිටවන නිපුණ ශිල්පීන්ට රැකියා අවකාශ සීමා සහිත වීම සහ ඒ හේතුවෙන් යම් පාඨමාලා සඳහා අඩු ඉල්ලුම
- පර්යේෂණ සහ නවෝත්පාදන අංශය සඳහා ප්‍රමාණවත් පරිදි අරමුදල් නොලැබීම
- රටෙහි පර්යේෂණ සහ සංවර්ධන අංශය සඳහා පෞද්ගලික අංශයේ දායකත්වය සහතික කිරීම උදෙසා යාවත්කාලීන කරන ලද ප්‍රතිපත්තීන් සහ උපායමාර්ග නොතිබීම
- පර්යේෂණ වානිජකරණ ගැටලු
- විද්‍යාඥයන් සහ පර්යේෂකයන්ගේ බුද්ධි ගලනය
- ඇතිකර ගනු ලැබූ ජාත්‍යන්තර සහයෝගීතාවන් ප්‍රමාණවත් නොවීම



2024.04.04

පරිච්ඡේදය 03

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමස්ත මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

3.1. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසිඒ-එෆ්

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2023		සටහන	තත්‍ය 2023	තත්‍ය 2022	
රු.			රු.	රු.	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	**1**	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	**2**	-	-	**ඒසිඒ-1**
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	**3**	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	**4**	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		2,002,904,911	1,813,473,700	**ඒසිඒ-3**
-	නැන්පතු		72,010,055	30,107,215	**ඒසිඒ-4**
-	අත්තිකාරම් ගිණුම්		24,747,647	23,146,589	**ඒසිඒ-5**
-	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**2,099,662,613**	**1,866,727,504**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**2,099,662,613**	**1,866,727,504**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)			-	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		**2,099,662,613**	**1,866,727,504**	
	අඩුකළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		-		
634,100,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	**5**	600,263,780	1,116,712,834	
245,650,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	**6**	199,659,450	207,503,503	**ඒසිඒ-2(ii)**
7,273,950,000	සහනාධාර , ප්‍රදාන සහ මාරුකිරීම්	**7**	5,804,683,818	5,769,070,990	
-	පොළී ගෙවීම්	**8**	-	-	
300,000	වෙනත් පුනරාවර්තන වියදම්	**9**	112,500	-	
8,154,000,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**6,604,719,548**	**7,093,287,327**	
	මූලධන වියදම්				
332,800,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	**10**	90,188,499	255,340,079	
768,100,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	**11**	955,974,763	309,778,384	
1,377,000,000	ප්‍රාග්ධන මාරුකිරීම්	**12**	490,489,000	502,114,442	**ඒසිඒ-2(ii)**
80,000,000	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	**13**	14,598,131	20,000,000	
1,100,000	හැකියා වර්ධනය	**14**	937,037	54,552,152	
1,250,000,000	වෙනත් මූලධන වියදම්	**15**	1,580,955,041	1,062,874,917	
3,809,000,000	**මුළු මූලධන වියදම් (උ)**		**3,133,142,472**	**2,204,659,975**	
	නැන්පතු ගෙවීම්		58,640,691	15,709,131	**ඒසිඒ-4**
	අත්තිකාරම් ගෙවීම්		13,158,059	15,370,633	**ඒසිඒ-5**
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**71,798,749**	**31,079,764**	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		**9,809,660,769**	**9,329,027,065**	
11,963,000,000	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		**(7,709,998,156)**	**(7,462,299,561)**	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		**(7,709,998,156)**	**(7,462,299,561)**	**ඒසිඒ-7**
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	**ඒසිඒ-3**
			-	-	

3.2. මූල්‍ය තත්ව පිළිබඳව ප්‍රකාශය

ඒඑෆ්-8

2023 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	සමාප්ත 2023 රු.	2022 රු.
මූල්‍ය සහාවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒඑෆ්-6	6,477,826,083	5,532,984,313
මූල්‍ය වත්කම්			
අත්කිකාරක ආයුතු	ඒඑෆ්-5/5(ඒ)	51,960,757	63,550,346
මූල්‍ය හා මූල්‍ය සමාගම ආ	ඒඑෆ්-3	-	-
මූල වත්කම්		**6,529,786,840**	**5,596,534,658**
ගුද්ධ වත්කම් / ස්වාමිත්වය			
කාණ්ඩිකාරය සමග ගුද්ධ වත්කම්		(218,598,561)	(193,639,608)
දේපළ පිරියත හා උපකරණ සංවිතය		6,477,826,083	5,532,984,313
කුලී හා වැට අත්කිකාරක සංවිතය	ඒඑෆ්-5(බී)	-	-
බැංකු වගකීම්			
කැන්පතු ආයුතු	ඒඑෆ්-4	270,559,318	257,189,954
අනුමිත ගෙවීම	ඒඑෆ්-3	-	-
මූල වගකීම්		**6,529,786,840**	**5,596,534,658**

මිටු අංක 07 සිට 08 දක්වා ඒඑෆ් 1 සිට ඒඑෆ් 7 දක්වා වූ ඇතමේ පහසුවලින් ඉදිරිපත් කෙරෙන මූල්‍ය තොරතුරු සහ ඇතිළුම් මිටු අංක 62 සිට 77 දක්වා ඇතුළත් මූල්‍ය සටහන් වලින් ද මෙම අධ්‍යක්ෂ මූල්‍යමණ්ඩල අත්තරීකය සොයාගත් වේ. මෙම මූල්‍ය ප්‍රකාශනා සිදුකෙරූ සිරීම් නොලෙව් සිදුවන් මූල්‍ය ආයුතු මූල්‍ය ධාරිතාවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් ඔවුන් හොඳින්ම කර ඇති පරිදි වර්තන් සුදුසු මූල්‍යමණ්ඩල ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවශ්‍ය මූල්‍යමණ්ඩි සඳහන් සංගය, ඊට අදාළ මූල්‍ය සටහන් හා අනෙකුත් මූල්‍ය තොරතුරු කාණ්ඩිකාරක මූල්‍ය සහාය සමඟ සැසඳීම කර ඇති බවටත් ඒවා එම සංගය සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමි.

මූල්‍ය පාලනය සඳහා වලදාගි අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති වලදාගි වලය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම සිදුකිරීමට වගීන් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමි.

Jayasundara

ප්‍රධාන ගණකාධිකරණ නිලධාරි
නම ජේ. එම්. සිලකා ජයසුන්දර
මෙරුණි
තනතුර අධ්‍යාපන අමාත්‍යාංශය
"ඉසුරුපාය" පැලවත්ත
දිනය මාතරගමුව.
2024.04.04

.....
ගණකාධිකරණ නිලධාරි
නම :
තනතුර
දිනය : 2024.04.

.....
ආයතන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂක (මූල්‍ය)/ සහකාරක් (මූල්‍ය)
නම : ආර්.එම්.පී.එම්. කුමාරි
දිනය : 2024.02. 19

3.3. මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ඒසීඒ-සී

2023 දෙසැම්බැර් 31 දිනෙන් අවසන්වන වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තක්ෂ	
	2023	**2022**
	රු.	**රු.**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	50,564,112	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	-	39,404,959
අග්‍රිම ලැබීම්	2,002,904,911	1,813,473,700
අත්තිකාරම් අයකර ගැනීම්	18,619,896	17,865,187
තැන්පතු ලැබීම්	72,010,055	30,107,215
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**2,144,098,974**	**1,900,851,061**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	782,342,451	731,530,806
සහනාධාර සහ මාරුකිරීම්	377,142,777	297,383,577
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරණ ලද වියදම්	1,311,160	44,301,107
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	-	-
අත්තිකාරම් ගෙවීම්	9,075,408	12,216,109
තැන්පතු ගෙවීම්	58,640,691	15,709,131
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**1,228,512,487**	**1,101,140,730**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**915,586,487**	**799,710,332**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
මූලධන වියදම්	915,586,487	799,710,332
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**915,586,487**	**799,710,332**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(915,586,487)**	**(799,710,332)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) +(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.4. වාර්තා කිරීමේ පදනම

1). වාර්තා කරන කාල පරිච්ඡේදය

2023 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාල පරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරන කාල පරිච්ඡේදය වේ.

2). මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.
මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3). ආදායම් හඳුනා ගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4). දේපල, පිරියත හා උපකරණ හඳුනා ගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපල, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ. දේපල, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5). දේපල, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපල, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම් වේ.

6). මුදල් හා මුදල් සමාන දෑ

2023 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

3.5. ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

අදාල නොවේ

3.6. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

රු.

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	8,154,000,000	8,154,000,000	6,604,719,548	81%
ප්‍රාග්ධන	3,809,000,000	5,099,100,000	3,133,142,472	61%
එකතුව	**11,963,000,000**	**13,253,100,000**	**9,737,862,020**	73%

3.7. මු.රෙ.208 ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද ප්‍රතිපාදනයේ % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසන් ප්‍රතිපාදන		
1	බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව - 334	වැටුප් හා දීමනා සඳහා	1,278,411	1,278,411	1,014,653	79%
2	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව -253	ණය ශේෂ පියවීම සඳහා	296,506	296,506	296,506	100%
එකතුව			**1,574,917**	**1,574,917**	**1,311,159**	83%

3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

වත්කම් කේතය	කේත විස්තරය	2023.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	2023.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැඟිලි හා ව්‍යුහයන්	**1,648,514,058.00**	**1,648,514,058.00**	**-**	**100%**
9152	යන්ත්‍රෝපකරණ	**1,222,193,884.95**	**1,222,193,884.95**	**-**	**100%**
9153	ඉඩම්	**1,494,318,140.00**	**1,494,318,140.00**	**-**	**100%**
9160	ඉදිවෙමින් පවතින ගොඩනැඟිලි	**2,112,800,000.00**	**2,112,800,000.00**	**-**	**100%**

3.9. විගණකාධිපති වාර්තාව

විගණකාධිපති වාර්තාව I වන වෙළුමෙහි 3.9 හි ඇතුළත් කර ඇත.

පරිච්ඡේදය 04

කාර්යසාධන දර්ශක

4.1. කාර්යසාධන නිර්ණායකයන් (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂ නිර්ණායකයන්	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස සත්‍ය නිමැවුමේ		
	100%-90%	75% - 89%	50% - 74%
කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු වැඩසටහන් සඳහා සිසුන් බඳවා ගැනීම	√		
නිකුත් කළ සහතිකපත් ප්‍රමාණය		√	
විෂයමාලා සංවර්ධනය		√	
ජාතික නිපුණතා සම්මත සංවර්ධනය	√		
පිරිනමනු ලැබූ පර්යේෂණ ප්‍රදාන සංඛ්‍යාව	√		
ස්ථාපනය කරන ලැබූ ඒකාබද්ධ පර්යේෂණ/ පර්යේෂණ - කර්මාන්ත සහයෝගීතා සංඛ්‍යාව	√		
ප්‍රකාශයට පත් කරනු ලැබූ පර්යේෂණ පත්‍රිකා සංඛ්‍යාව	√		
ලබාගත් දේශීය/ජාත්‍යාන්තර ඇගයීම් සංඛ්‍යාව	√		
ලබාගත් දේශීය/ ජාත්‍යාන්තර පේටන්ට් සංඛ්‍යාව			√
විද්‍යාව ප්‍රචලිත කිරීම අරමුණු කරගනිමින් පවත්වනු ලැබූ වැඩසටහන් සංඛ්‍යාව	√		
විද්‍යාව ප්‍රචලිත කිරීම අරමුණු කරගනිමින් පවත්වනු ලැබූ වැඩසටහන් සඳහා සහභාගී වූ සංඛ්‍යාව			√
ප්‍රකාශයට පත්කරනු ලැබූ විද්‍යා ක්ෂේත්‍රය හා සම්බන්ධ ප්‍රකාශනයන් සංඛ්‍යාව			√
දේශීය/ ජාත්‍යාන්තර වශයෙන් අත්සන් තබනු ලැබූ තාක්ෂණය පවරාදීම පිළිබඳ ගිවිසුම් සංඛ්‍යාව			√
දේශීය/ ජාත්‍යාන්තර වශයෙන් වාණිජකරණය සිදුකළ පර්යේෂණ නිපැයුම් සංඛ්‍යාව			√
වාණිජකරණය සඳහා මූල්‍යමය සහාය ලබාදුන් නව නිපැයුම් සංඛ්‍යාව		√	
දේශීය/ ජාත්‍යාන්තර වශයෙන් අත්සන් තබනු ලැබූ විද්‍යාව, නවෝත්පාදන සහ තාක්ෂණ සහයෝගීතාවයන්			√
සාර්ථකව නිම කළ විද්‍යාව, නවෝත්පාදන සහ තාක්ෂණ සහයෝගීතාවයන්			√

පරිච්ඡේදය 05

තිරසර සංවර්ධන අරමුණු සපුරාගැනීම පිළිබඳව කාර්යසාධනය

5.1. හඳුනාගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු දක්වන්න

ඉලක්ක/අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ	මේ දක්වා ලබා ඇති ප්‍රගතිය		
			0% - 49%	50% - 74%	75% - 100%
4. පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම.	4.3. 2030 වන විට සියලුම කාන්තාවන්ට සහ පිරිමින්ට ගුණාත්මක වශයෙන් ඉහළ සහ අඩු මුදලකට ලබා ගත හැකි විශ්වවිද්‍යාල අධ්‍යාපනය ද ඇතුළත්ව තාක්ෂණික, වෘත්තීය සහ තෘතීයික අධ්‍යාපනය ලබා ගැනීමට සම අවස්ථා සහතික කිරීම.	4.3.1. වෘත්තිය පුහුණු ක්ෂේත්‍රයේ වයස අවු. 15-25ත් අතර තරුණ ජනගහනයේ සහභාගීත්ව ප්‍රතිශතය.	√		
	4.4. 2030 වනවිට සුනිසි රැකියා සහ ව්‍යවසායකත්වයක් සඳහා තාක්ෂණික හා වෘත්තීය සුදුසුකම් ඇතුළුව අදාළ කුසලතා ලබා සිටින තරුණයින් සහ වැඩිහිටියන්ගේ සංඛ්‍යාව සැලකිය යුතු මට්ටමින් ඉහළ නැංවීම	4.4.1 තොරතුරු සන්නිවේදනය හා බහු මාධ්‍ය ක්ෂේත්‍රයට බඳවාගත් සිසුන් එම ක්ෂේත්‍රය සඳහා බඳවාගැනීමට අපේක්ෂාකළ සිසුන් ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස			√
	4.5 2030 වනවිට අධ්‍යාපනයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ වෙනස්කම් තුරන් කිරීම හා ආබාධිත පුද්ගලයන්ට, ස්වදේශිකයන්ට සහ අවධානම් අවස්ථාවල සිටින ළමුන් ඇතුළු අවධානමට ලක්විය හැක්කන් සඳහා අධ්‍යාපනයේ සහ වෘත්තීය පුහුණුවෙහි (ස්ත්‍රී/පුරුෂ, ග්‍රාමීය/නාගරික, ධනවත්භාවයේ මට්ටම යන පංචමකය සහ ආබාධිත මට්ටම, ස්වදේශික ජනයා සහ ගැටුම් බලපෑම් ආදී දත්ත පවත්නා බව අනුව) සියලුම මට්ටම්වලට ප්‍රවේශ වීමේ අවස්ථාව තහවුරු කිරීම.	4.5.1 වෘත්තීය පුහුණුව අවසන් කළ ස්ත්‍රී ශිෂ්‍ය සංඛ්‍යාව වෘත්තීය පුහුණුව අවසන් කළ පුරුෂ ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස		√	

8. සුනිසි කාර්යයන් සහ ආර්ථික වර්ධනය	8.2. විවිධාංගීකරණය, තාක්ෂණික වැඩිදියුණු කිරීම් සහ නවෝත්පාදනයන් හරහා ඉහළ ආර්ථික ඵලදායීතා මට්ටමක් ළඟාකර ගැනීම	8.2.1 එක් රැකියා නියුක්තිකයෙකුට සත්‍ය දළ දේශීය නිෂ්පාදිතයෙහි වාර්ෂික වර්ධන අනුපාතය		√	
9. සවිමත් යටිතලයන් ගොඩනැංවීම, අංගසම්පූර්ණ සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය සහ නවෝත්පාදනය පෝෂණය කිරීම	9.5 නවෝත්පාදන දිරිමත්කිරීම සහ මිලියන 1ක ජනගහනයක් සඳහා සිටින පර්යේෂණ හා සංවර්ධන අංශයේ සේවකයන් සහ රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ පර්යේෂණ වියදම් සැලකිය යුතු අන්දමින් ඉහළ දැමීම හරහා 2030 වර්ෂය වනවිට, සංවර්ධනය වෙමින් පවතින රටවලට සුවිශේෂීව, සියලු රටවල්හි විද්‍යාත්මක පර්යේෂණ හා කාර්මික අංශයේ තාක්ෂණික හැකියාවන් ඉහළ නැංවීම	9.5.1පර්යේෂණ සහ සංවර්ධන වියදම්, දළ දේශීය නිෂ්පාදිතයෙහි අනුපාතයක් ලෙස		√	
	9.ආ. කාර්මික විවිධාංගීකරණය සහ පාරිභෝගික භාණ්ඩ සඳහා අගයන් එක් කිරීම හරහා හිතකර ප්‍රතිපත්තිමය පරිසරයක් සහතික කරමින්, සංවර්ධනය වෙමින් පවතින රටවල දේශීය තාක්ෂණ සංවර්ධනය, පර්යේෂණ හා නවෝත්පාදන සඳහා සහාය ලබා දීම.	9 ආ.1 අගය එක් කළ මධ්‍යම සහ අධි-තාක්ෂණික කර්මාන්ත නිෂ්පාදිතයන්, සමස්ත අගය එක් කළ නිෂ්පාදිතයන්හි අනුපාතයක් ලෙස		√	

5.2. තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීමේ අභියෝග සහ ජයග්‍රහණයන්

අභියෝග

- බඳවාගැනීම් පිළිබඳ රජයේ මෑතකාලීන ප්‍රතිපත්තිමය තීරණ නිසා වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ විශාල උපදේශකවරුන්ගේ හිඟතාවය සහ අඩු පාරිතෝෂික ගෙවීම් මත සුදුසුකම්ලත් දේශකයන් සහ උපදේශකවරුන් ආකර්ෂණය කරගැනීම සහ රඳවා ගැනීම.
- සේවා සහ වෙළඳ ක්ෂේත්‍රයේ රැකියාවන් සඳහා පවතින ආකර්ෂණය හේතුවෙන් කාර්මික පාඨමාලා සඳහා තරුණ පිරිස් විශේෂයෙන් කාන්තාවන් ආකර්ෂණය කරගැනීම.

- ජීවන වියදම ඉහළයෑම හේතුවෙන් ළමුන් විධිමත් පුහුණු පාඨමාලා සඳහා යොමුවීම වෙනුවට ප්‍රාථමික ආදායම් මාර්ග වෙත යොමු වීම.
- පසුගිය වසර කිහිපය තුළ පර්යේෂණ සහ සංවර්ධන අංශයේ ආයෝජනයන් සඳහා අඩු ප්‍රමුඛතාවයක් හිමිවීම.
- රාජ්‍ය ආයතන, නියාමකයින්, පර්යේෂණ ආයතන, විශ්වවිද්‍යාල, ව්‍යාපාර, උපදේශන සමාගම් සහ වෘත්තිමය / ව්‍යාපාර කණ්ඩායම්වලින් සෑදුම් ලත් සක්‍රීය ජාලයක් නොපැවතීම.
- නිපුණතා සහිත මානව සම්පත් ප්‍රමාණවත් නොවීම.
- හිතකර පර්යේෂණ සහ නවෝත්පාදන පරිසර පද්ධතියක් නොතිබීම
- රජයේ චේතන ක්‍රමවේදයේ ප්‍රතිඵලයක් ලෙස පර්යේෂණ ආයතන තුළ වෘත්තිකයින් රඳවා තබා ගැනීමේ ගැටලු
- විද්‍යාඥයින් සහ පර්යේෂකයින්ගේ බුද්ධි ගලනය

ජයග්‍රහණයන්

- 2023 වසරේ වෘත්තීය පුහුණු ක්ෂේත්‍රය සඳහා වයස අවු 15-24 වූ තරුණ ජනගහනයෙන් 10.2% සහභාගීත්වය ළඟාකර ගත හැකි වීය.
- නිපුණතා සංවර්ධන හා වෘත්තීය අධ්‍යාපන අංශය යටතේ ඇති වෘත්තීය පුහුණු ආයතනවල 2023 වර්ෂය සඳහා බඳවාගත් මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 18.5% ක් පමණ ප්‍රමාණයක් සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිපුණතාවය ලබාදීමට හැකි වී ඇත.
- 2023 වර්ෂයේදී පුහුණුව අවසන් කළ ස්ත්‍රී ශිෂ්‍ය සංඛ්‍යාව, පුහුණුව අවසන් කළ පුරුෂ ශිෂ්‍ය සංඛ්‍යාවට දක්වන අනුපාතය ප්‍රතිශතයක් ලෙස ගත් විට 70% කි.
- 2023 වර්ෂයේදී SLIBTEC හා SLINTEC ආයතනයන් හී සවිමත් යටිතලයන් ගොඩනැංවීම තුළින් රටෙහි විද්‍යාත්මක,පර්යේෂණ හා කාර්මික අංශයේ තාක්ෂණික හැකියාවන් ඉහළ නැංවීම සඳහා දායකත්වය ලබා දීමට හැකි වීම.
- පොහොර වර්ග වැඩි දියුණු කිරීම සහ පාංශු කළමනාකරණය හරහා නිසරු වූ බිම් සාරාවත්භාවයට පත් කිරීම ව්‍යාපෘතිය යටතේ ජෛව පටල ජෛව පොහොර (BF BF)භාවිතය තව දුරටත් ගොවීන් අතර ප්‍රචලිත කිරීම මඟින් කෘෂිකාර්මික නිෂ්පාදන ධාරිතාව වැඩිකර එමඟින් ආර්ථික වර්ධනය සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබා දීමට හැකි වීම.

පරිච්ඡේදය 06
මානව සම්පත් පැතිකඩ

6.1. 2023.12.31 දිනට කාර්යමණ්ඩල තොරතුරු

සේවා මට්ටම	අනුමත සේවක සංඛ්‍යාව	දැනට සිටින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු / අතිරික්තය
ජ්‍යෙෂ්ඨ	48	40	08
තෘතීයික	05	03	02
ද්විතීය	611	539	72
ප්‍රාථමික	69	68	01
කොන්ත්‍රාත් /අනියම් /තාවකාලික	01	01	-
එකතුව	734	651	83

6.2. මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණුලාභී නිලධාරීන් සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය	වැඩසටහනේ ස්වභාවය (දේශීය / විදේශීය)		නිමැවුම / ලබා ගත් දැනුම
				දේශීය	විදේශීය	
කාර්යාල ලිපිගොනු කරණය පුහුණු වැඩමුළුව.	23	2023.01.26 දින කාලය පැය 4 (පෙ.ව.9.00- ප.ව. 12)	සම්පත් දායකත්වය මත වැඩසටහන පවත්වන ලදී. සම්පත් දායක දීමනාව රු.3500.00	දේශීය	-	ලිපිගොනුකරණය පිළිබඳ නිලධාරීන්ගේ දැනුම / කුසලතාවය වර්ධනය වීම, හා නිලධාරීන්ගේ කාර්යයක්ෂමතා කඩඉම් විභාගය සඳහා උපකාරී වීම.
කාර්යාල ලිපිගොනු කරණය පුහුණු වැඩමුළුව (අමාත්‍යාංශයේ අංශවල සේවය නියුතු සංවර්ධන නිලධාරීන් /කළමනාකරණ සේවා නිධාරීන්)	29	2023.02.10 දින කාලය පැය 4 (පෙ.ව.9.00- ප.ව. 12)	සම්පත් දායකත්වය මත වැඩසටහන පවත්වන ලදී. සම්පත් දායක දිමනාව රු.3500.00	දේශීය	-	ලිපිගොනුකරණය පිළිබඳ නිලධාරීන්ගේ දැනුම / කුසලතාවය වර්ධනය වීම හා නිලධාරීන්ගේ කාර්යයක්ෂමතා කඩඉම් විභාගය සඳහා උපකාරී වීම.

මානව සම්පත් දැනුම වර්ධනය කිරීම පිණිස පුහුණු පාඨමාලාව (අංශයේ යටතේ ඇති ආයතනවල මාණ්ඩලික නිලධාරීන් සඳහා)	100	2023.11.04 (එක් දින)	අනුග්‍රාහක දායකත්වය NSBM ආයතනය විසින් සිදු කරන ලදී. රු.12,900.00ක මුදලක් සම්පත් දායක දීමනාව සඳහා අමාත්‍යාංශය විසින් දරා ඇත.	**දේශීය**	-	යාවත්කාලීන කරන ලද ර.ප.ව. සහ මුදල් චක්‍රලේඛ පිළිබඳව, අංශය යටතේ ඇති ආයතනවල පනත්වල ඇති නෛතික ගැටළු සහ පුද්ගල අභිප්‍රේරණය
මානව සම්පත් දැනුම වර්ධනය කිරීම පිණිස පුහුණු පාඨමාලාව (සංවර්ධන නිලධාරීන් සහ කළමනාකරණ සේවා නිලධාරීන් සඳහා)	120	2023.11.03 (එක් දින)	අනුග්‍රාහක දායකත්වය NSBM ආයතනය විසින් සිදු කරන ලදී. සම්පත් දායක දීමනාව සඳහා අමාත්‍යාංශය විසින් දරා ඇත.	**දේශීය**	-	ආයතන සංග්‍රහය පිළිබඳව මූලික අවබෝධය, රාජ්‍ය සේවයේ ආරම්භය පිළිබඳව දැනුම සහ පුද්ගල අභිප්‍රේරණය
Diploma in Procurement & Contract Administration 2023 - 2024	02	2023.10.15 ආරම්භය (අවුරුදු 01)	(NILS) National Institute of Labor Studies එක් නිලධාරියෙක් සඳහා රු. 60,000.00 නිලධාරීන් දෙදෙනා සඳහා රු. 120,000.00	**දේශීය**	-	ප්‍රසම්පාදන මූලධර්ම සහ මෙම අංශයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය විධිමත්ව හා කාර්යක්ෂමව කිරීම.
බහුකාර්යය කාර්යසහායක බලකා දෙපාර්තමේන්තුව යටතේ අළුතින් බඳවා ගන්නා ලද කා.කා.ස නිලධාරීන් සහ රියදුරන් සඳහා රාජ්‍ය සේවයේ මූලික කාර්යයභාරය මූලික විනය සම්බන්ධව	45	2023.12.16 සහ 2023.12.17 දෙදින (නේවාසික)	රු. 256,920.00 අමාත්‍යාංශ ප්‍රතිපාදන මඟින්	**දේශීය**	-	පුද්ගල සේවාරම්භක පුහුණුව කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා උපකාරී වීම. රියදුරු මහතුන් සඳහා මෝටර් රථ අඳා පනත සහ උසාවි දඩ ගැසීම පිළිබඳව අවබෝධය කා.කා.ස නිලධාරීන් සඳහා ආයතන සංග්‍රහය සහ මුදල් රෙගුලාසි සම්බන්ධව සහ එම නිලධාරීන්ගේ කාර්යභාරය පිළිබඳව අවබෝධය

පරිච්ඡේදය 07
අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිවරදි කිරීමේ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්.	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්).	අදාළ නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්.	අදාළ නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්.	අදාළ නොවේ		
1.6	වෙනත්	-		
2	**පොත් පත් හා ලේඛන නඩත්තු කිරීම. (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙළකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		

2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වා ගෙන යාම.	වාහන සම්බන්ධව පමණක් හානි පාඩු ලේඛනයක් පවත්වාගෙන යනු ලබයි.		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීනකර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
3.	**මුල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ 135)**			
3.1	මුල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම.	අනුකූල වේ		
3.2	මුල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත්කර තිබීම.	අනුකූල වේ		
3.3	සෑම ගණුදෙණුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම.	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම.	අනුකූල වේ		
4.	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
4.3	සමාලෝචිත වර්ෂ සඳහා 1971 අංක 38 දරණ මුදල් පනත ප්‍රකාරව අයවැය සම්මත කරගෙන තිබීම.	අනුකූල වේ		
4.4	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		

4.5	වාර්ෂික ඇස්තමේන්තු සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NDB) නියමිත දිනට ඉදිරිපත්කර තිබීම.	අනුකූල වේ		
4.6	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත්කර තිබීම.	අනුකූල වේ		
4.7	කාර්තු වාර්තා නියමිත දිනට මහාභාණ්ඩාගාරය වෙත ඉදිරිපත්කර තිබීම.	අනුකූල වේ		
5.	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම.	අනුකූල වේ		
6.	**අභ්‍යන්තර විගණනය මු,රෙ.134(2)**			
6.1	මු,රෙ.134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
6.2	සියළු අභ්‍යන්තර විගණන වාර්තා සඳහා මසක් ඇතුළත පිළිතුරු සපයා තිබීම.	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත්කර තිබීම.	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත්කර තිබීම	අනුකූල වේ		
7.	විගණන හා කළමනාකරණ කමිටු			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන කළමනාකරණ කමිටු 04ක්වත් අදාළ වර්ෂය තුළ පවත්වා ගෙන තිබීම.	අනුකූල වේ		
8.	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිළදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත්කර තිබීම.	අනුකූල වේ		

8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොමිස්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත වාර්තා කර තිබීම.	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව භාණ්ඩ සමීක්ෂණය පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම.	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය මු.රෙ.772 අනුව සිදු කිරීම.	අනුකූල වේ		
9.	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත්කර තිබීම.	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කරතිබීම.	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,104,109,හා 110 ප්‍රකාරව කටයුතු කිරීම.	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම.	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල වේ		
10.	**බැංකු ගිණුම් කළමනාකරණය**			

10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළකර සහතිකකර ඒවා විගණනය සඳහා ඉදිරිපත්කර තිබීම.	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල්කර තිබීම.	අදාළ නැත		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල්කර තිබීම.	අනුකූල වේ		
11.	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම්වලට එළඹීම.	අනුකූල වේ		
11.2	මු.රෙ.94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීම.	අනුකූල වේ		
12.	**රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූල වීම.	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම.	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල්කර තිබීම.	අනුකූල නොවේ		ණය අය කර ගැනීමට උපරිම ක්‍රියාමාර්ග ගැනීම සහ නීතිමය ක්‍රියාමාර්ග ගැනීම.
13.	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල්ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතුකර තිබීම.	අනුකූල නොවේ		වසර 2ක් ඉක්ම වූ තැන්පතු රජයේ ආදායමට නියමිත කාලයේදී බැර කිරීමට කටයුතු කිරීම
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීනකර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
14.	**අග්‍රිම ගිණුම**			

14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණයකර තිබීම.	අනුකූල වේ		
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල්කර තිබීම.	අනුකූල වේ		
14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරුඅග්‍රිම නිකුත්කර තිබීම.	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම.	අනුකූල වේ		
15.	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම.	අදාළ නැත		
15.2	රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැරකර තිබීම.	අනුකූල වේ		
15.3	මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත්කර තිබීම.	අනුකූල වේ		
16.	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම.	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දීම.	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍ර ලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත්කර තිබීම.	අනුකූල වේ		
17.	**මහජනයා වෙත තොරතුරු ලබා දීම.**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		

17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා /චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම.	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත්කර තිබීම.	අනුකූල වේ		
18.	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය චක්‍රලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මකකර තිබීම.	අනුකූල වේ		
18.2	එම චක්‍ර ලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම.	අනුකූල වේ		
19.	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම.**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම්කර ගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම.	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන්කර තිබීම.	අනුකූල නොවේ		මානව සංවර්ධන සැලැස්ම චක්‍රලේඛ 02/202ඇමුණුම 01 ප්‍රකාරව කාර්යසාධන ගිවිසුම නිලධාරීන්ට ලබා දීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.
19.4	ඉහත චක්‍ර ලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවරධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම	අනුකූල වේ		

	පිළිබඳ වගකීම පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම.			
20.	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම.**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	අනුකූල වේ.		